# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

# 2018

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
National Institute of Language Education and Training

# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

## වාර්ෂික වාර්තාව - 2018

## පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| 01) | | හැඳින්වීම | |
| | 1.1) | ආයතනයේ පිහිටීම | 1 |
| 02) | | ආයතනයේ පරමාර්ථ | 2 |
| 03) | | ආයතනයේ කර්තව්‍යන් | 3 |
| 04) | | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය කළමනාකරණ මණ්ඩල තොරතුරු | 4 - 5 |
| 05) | | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය උපදේශක මණ්ඩල තොරතුරු | 6 |
| 06) | | 2018 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් | 7 |
| 07) | | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය අධ්‍යයන මණ්ඩල කාර්යභාරය | 8 |
| 08) | | 2018 වර්ෂයේ ආයතන කාර්ය මණ්ඩල තොරතුරු | |
| | 8.1) | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම | 9 |
| | 8.2) | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය | 10 – 12 |
| | 8.3) | ආයතනයේ සංයුතිය | 13 |
| | 8.4) | පාලන අංශය | 13 – 14 |
| | 8.5) | සැලසුම් අංශය | 15 – 18 |
| | 8.6) | පුහුණු අංශය | 19 – 34 |
| | 8.7) | අභ්‍යන්තර විගණන අංශය | 35 – 38 |
| | 8.8) | ගිණුම් අංශය | 39 – 59 |
| 09) | | විගණකාධිපති වාර්තා | 60 – 69 |

## සභාපතිතුමාගේ පණිවිඩය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වත්මන් සභාපතිවරයා ලෙස ආයතනික වාර්ෂික වාර්තා සඳහා පණිවුඩයක් එක් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

2020 වර්ෂයේ පෙබරවාරි මස අගභාගයේ ඇරඹි මාගේ ධුර කාලයෙන් පසු ආයතනික අභිවෘද්ධිය අපේක්ෂාවෙන් ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. එහිදී ආයතනයේ ප්‍රධාන කාර්යයක් වන වාර්ෂික වාර්තා නිසි කලට සපයා නොතිබීම පිළිබඳව කරුණු සනාථ වූ අතර 2017 සිට 2019 දක්වා වාර්ෂික වාර්තා තුනක් ම කඩිනම්ව සකසා ඉදිරිපත් කිරීමට සිදුවූ බැවින් එම වාර්තා තුනටම මා හට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

ඒ අනුව උක්ත වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සක්‍රිය කළ අතර ඒ සඳහා අවශ්‍ය නියාමනය සහ මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් තත් කාර්ය සාර්ථකත්වයට පත් කිරීමට හැකිවීම මාගේ ප්‍රහර්ෂයට කරුණකි . එසේම අප විසින් ඉදිරිපත් කරන මෙම වාර්ෂික වාර්තා මේ වන විට ආයතනික වෙබ් අඩවිය ඔස්සේ පරිශීලනය කිරීමේ හැකියාවද සලසා ඇත.

තවද "සෞභාග්‍යයේ දැක්ම " යථාර්ථයක් කරනු වස් , ආයතනික මෙහෙවර ප්‍රකාශනයේද සඳහන් පරිදි ලාංකේය ජනතාව භාෂාන්තර ඥානයෙන් සන්නද්ධ කොට ඔවුන් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ ජාතික කර්තව්‍ය වෙනුවෙන් පෙනී සිටින රජයේ සන්නාමලත් ආයතනය වන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අභිවෘධිය පිණිස මාගේ මෙම ප්‍රයත්නය හේතු වනු ඇතැයි මා විශ්වාස කරමි.

සභාපති

ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද

# 1. ආයතනයේ පිහිටීම

## 1.1 කොළඹ ප්‍රධාන කාර්යාලය

2018 වර්ෂයේදී ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි ප්‍රධාන පරිපාලන කටයුතු සිදුකරගෙන යනු ලැබුවේ අංක 321/1, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය යන ස්ථානයෙහිය. දීපව්‍යාප්තව, භාෂාව ඉගැන්වීම පිළිබඳ විවිධ පාඨමාලා සංවිධානය කිරීම සහ සැලසුම් කිරීම ඇතුළු ආයතනයෙහි සියලුම කර්තව්‍යයන් වඩාත් පෘථුල වශයෙන් පවත්වා ගෙන යාම සඳහා කොළඹ කාර්යාලය සංස්ථාපනය කර ඇත.

## 1.2 අගලවත්ත පුහුණු ආයතනය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි අගලවත්ත භාෂා මධ්‍යස්ථානය කොළඹ සිට කි.මී. 100ක් පමණ දුරින් කළුතර දිස්ත්‍රික්කයෙහි අගලවත්ත, ගලේවත්ත නම් ප්‍රදේශයෙහි ස්ථාපනය කොට ඇත.

ජාතික වැව්ලි කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පැවති අක්කර 2.5ක පමණ භූමි ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකින් අනතුරුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත පවරා ඇති අතර, ආයතනයෙහි ආරම්භයේ සිට මේ දක්වා පුහුණු පාඨමාලා සාර්ථකව පැවැත්වීමට භූමිය හා පරිශ්‍රය ප්‍රබල ලෙස හේතු වී ඇත. භාෂා ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා සෞන්දර්යානන්දව, ප්‍රයෝගිකව සහ බුද්ධිවාදී ස්වරූපයෙන් සිදු කළ හැකි මනෝරම්‍ය වූ පරිසර ශෝභාවකින් හා මනස්කාන්ත භූමි නිමවුමකින් යුක්ත අගලවත්ත භාෂා පුහුණු මධ්‍යස්ථානය නේවාසික පහසුකම්වලින් සමන්විතය.



## 2. ආයතනයෙහි පරමාර්ථ

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක් ද, එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා දක්ෂ ගුරුවරුන් බිහිකිරීම.
- ලිඛිත නීතියකින් පිහිටුවන ලද භාෂා පරිවර්තන සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තන සේවයෙන් පත් කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවය ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් බිහි කිරීම.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.
- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.
- මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාව ඇති තැනැත්තන් පුහුණු කිරීම.



## 3. ආයතනයෙහි කර්තව්‍යන්

- සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ට සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ පුද්ගලයන් බිහි කිරීම සඳහා සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දීර්ඝ පුහුණුවක් ලබා දීම.
- ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා පර්යේෂණ හා අධ්‍යයනවල ප්‍රතිඵල භාවිත කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටලු පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීම.
- සුදුසු තැනැත්තන්ට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබා දීමත්, එම පුහුණුවීම් සහ අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කරන අපේක්ෂකයන්ට සහතික පත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- භාෂා ඉගැන්වීමේ කාර්යය සිදු කිරීම සඳහා පුහුණු පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවීම.
- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් සහ ලඝු ලේඛකයින් ආදී වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.



## 4. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2018 වර්ෂය සඳහා නිර්දේශිත කළමනාකරණ මණ්ඩල තොරතුරු

ආයතනයෙහි පරමාර්ථ වඩා කාර්යක්ෂම සහ ඵලදායීව ඉටුකිරීම පිණිස ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසිනි. 2007 අංක 26 දරන ජාතික භාෂා හා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 3(1) වන වගන්තිය ප්‍රකාරව ගරු ඇමතිතුමා විසින් පහත සඳහන් කළමනාකරණ මණ්ඩලය පත් කරනු ලැබ ඇත.

| *නම* | *තනතුර හා කාර්යාලීය ලිපිනය* | *පත්වීමේ දිනය* |
|---|---|---|
| **චන්දන අරුණදේව මහතා** | සභාපති<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය | 2017-01-02 සිට 2018-04-24 දක්වා |
| **වී.එම්.කේ.බී තෙන්නකෝන් මහතා** | සභාපති<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය | 2018-04-25 |
| **ප්‍රසාත් ආර්. හේරත් මහතා** | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය | 2008-08-02 |
| **වී.ජ්.සී කුමාරසිංහ මහතා** | අධ්‍යක්ෂ<br>රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය, කොළඹ 07 | 2015-11-16 සිට 2018-09-19 දක්වා |
| **සංජීවනී වීරසේකර මිය** | අධ්‍යක්ෂ<br>රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය, කොළඹ 07 | 2018-09-20 |
| **ආර්.එම්.එම් රත්නායක මහතා** | අධ්‍යක්ෂ / විදුහල්පති<br>අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල | 2015-07-23 සිට 2018-08-22 දක්වා |

| | | |
|---|---|---|
| **ආර්. කරුණාසිරි මහතා** | අධ්‍යක්ෂ<br>ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව<br>2 වන මහල, අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල | 2018-08-23 |
| **ආචාර්ය එස්. ශ්‍රීදරන් මහතා** | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2017-07-25 |
| **ඩබ්.ඒ.ඩී.සී රූපසිංහ මිය** | අතිරේක ලේකම් (පාලන හා මුල්‍ය)<br>ජාතික සහජීවන, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 2017-12-15 |
| **පී.හේමචන්ද්‍ර මහතා** | සංවිධාන හා ක්‍රම<br>21 වන මහල, ප්‍රධාන කාර්යාලය,<br>ලංකා බැංකුව, කොළඹ 01 | 2018-04-26 |
| **කේ. නගුලරාජා මිය** | රාමනාදන් හින්දු බාලිකා විද්‍යාලය<br>ලෝරන්ස් පාර, කොළඹ 04 | 2018-05-24 |
| **ඩබ්.ඩී. චන්ද්‍රිකා මිය** | ගණකාධිකාරි<br>රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව,<br>මහා භාණ්ඩාගාරය | 2015-11-16 |
| **එස්.ජී.එම්.ඒ.පී සේනාරත්න මිය** | ගණකාධිකාරි<br>රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව,<br>මහා භාණ්ඩාගාරය | 2018-06-21 |

## 5. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2018 වර්ෂය සඳහා ගරු ඇමතිතුමා විසින් පත්කරන ලද උපදේශක මණ්ඩල තොරතුරු

| *නම* | *තනතුර හා කාර්යාලීය ලිපිනය* | *පත්වීමේ දිනය* |
|---|---|---|
| **චන්දන අරුණදේව මහතා** | සභාපති<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය | 2017-01-02 සිට<br>2018-04-24 දක්වා |
| **ටී.එම්.කේ.බී තෙන්නකෝන් මහතා** | සභාපති<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය | 2018-04-25 |
| **ප්‍රසාත් ආර්. හේරත් මහතා** | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය | 2008-08-02 |
| **මහාචාර්ය අශෝක ප්‍රේමරත්න මහතා** | භාෂා වාග්විද්‍යා අංශය,<br>කැළණිය විශ්වවිද්‍යාලය | 2015-12-18 |
| **මහාචාර්ය කරුණානිධි මහතා** | අධ්‍යාපන අංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය | 2015-12-18 |
| **කරීමා ජයවීර මිය** | ඉංග්‍රීසි අධ්‍යාපන අංශය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2015-12-18 |
| **මහාචාර්ය ඩබ්.එම්. විජේරත්න මහතා** | භාෂා වාග්විද්‍යා අංශය,<br>කැළණි විශ්වවිද්‍යාලය | 2015-12-18 |

## 6. 2018 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයින්

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතෙහි අංක 07 පරිච්ඡේදයට අදාළව ගරු අමාත්‍යතුමන් විසින් ආයතනයේ අධ්‍යයන කටයුතුවලදී සැලසුම්, ප්‍රතිපත්ති සහ නිර්දේශ සඳහා අවශ්‍ය කොන්දේසි සහ වෙනත් කාර්යයන් වඩා නිවැරදිව හා කාර්යක්ෂමව සිදු කරනු වස් විවිධ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් භාෂාව, වාග් විද්‍යාව සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර අලළා විශ්ව විද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදු කරන ආචාර්ය මහාචාර්යවරුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි එකඟත්වයෙන් පහත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් ලෙස මෙම පිරිස ආයතනයෙහි ඉදිරි දැක්මෙහි ප්‍රධාන නියෝජිතයන් වශයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනු වස් සෘජුව බැඳී සිටි.

| නම | තනතුර හා කාර්යාලීය ලිපිනය |
|---|---|
| **චන්දන අරුණදේව මහතා** | සභාපති<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය |
| **ටී.එම්.කේ.බී තෙන්නකෝන් මහතා** | සභාපති<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය |
| **ප්‍රසාත් ආර්. හේරත් මහතා** | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය<br>අංක 321/1, මාකුඹුර, පන්නිපිටිය |
| **මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි** | අංශ ප්‍රධාන<br>සිංහල භාෂා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| **මහාචාර්ය රත්නසිරි අරංගල මහතා** | සිංහල සහ ජන සන්නිවේදන අංශය,<br>ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| **මහාචාර්ය දුෂ්සාන්ති මේන්ඩිස් මිය** | අංශ ප්‍රධාන<br>ඉංග්‍රීසි අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| **මහාචාර්ය රමේෂ් අබ්දුල්ලා මහතා** | අග්නිදිග විශ්වවිද්‍යාලය, මඩකලපුව |
| **කේ.එස්.ආර් පෙරේරා මහතා** | කොමසාරිස්<br>රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>අංක 341/7, කෝට්ටේ පාර, රාජගිරිය |
| **මහාචාර්ය වී. මහේෂ්වරන් මයා** | අංශ ප්‍රධාන<br>දෙමළ අධ්‍යනාංශය, පේරාදෙණි විශ්විද්‍යාලය |

## 7. අධ්‍යයන මණ්ඩලයේ කාර්යභාරය

- ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අදාළ විය හැකි යම් යම් කරුණු පිළිබඳ පනතේ විධි විධානයන්ට අනුව ආයතනයට උපදෙස් ලබා දීම.
- ආයතනයේ රීතිවලට අනුකූලව විභාග පැවැත්වීම, විභාග සමත් වී ඇති හා ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් යම් කොන්දේසිවලින් සෑහීමකට පත්ව ඇති ඩිප්ලෝමා සහතිකපත් සහ ආයතනයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තන් පිළිබඳ කළමනාකරණ මණ්ඩල වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ආයතනය වෙත මණ්ඩලය විසින් යොමු කරන ලද කිසියම් කරුණක් පිළිබඳ වාර්තා සැලකිල්ලට ගැනීම.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලාවලට සහ විභාග වලට සියලු කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩල වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතන විසින් පවත්වනු ලබා අධ්‍යයන පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලාවලට අදාළ නීති රීති සකස් කර කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනයේ අධ්‍යයන මණ්ඩලය පත් කිරීම, ඉවත් කිරීම සහ විනය පාලනයට අදාළ නීති, බඳවා ගැනීමේ පටිපාටි, වේතන, පරිශ්‍රමික දීමනා, ගාස්තු, සේවා කාලය සහ නිවාඩු ආදිය පිළිබඳ කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශිෂ්‍යත්ව ප්‍රදාන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ ත්‍යාග සඳහා සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳ කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශිෂ්‍යත්ව ප්‍රදාන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ ත්‍යාග සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසි සපුරා ඇති තැනැත්තන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යයන මණ්ඩලයේ අනුනියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටු පත්කිරීම.
- අධ්‍යයන මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ සහ එවැනි රැස්වීම්වලදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි පිළිබඳ රීති සකස් කිරීම.

## 8. ආයතනයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු

ආයතනයේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂක ජනරාල්වරයා වේ. කළමනාකරණ මණ්ඩලයෙහි විධානයන්ට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයතනයෙහි පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

1. ආයතනයේ පරිපාලන කටයුතු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම.
2. ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලයෙහි පත්කිරීම් හා ආයතනික පරිපාලන කටයුතු.
3. ආයතනය විසින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් අධීක්ෂණය, නියාමනය හා සම්බන්ධීකරණය.

## 8.1 කාර්ය මණ්ඩල බඳවා ගැනීම

2017 වසර අවසානය වන විට ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලය 33ක් විය. පුරප්පාඩු වී තිබූ තනතුරු සඳහා වැටුප් හා සේවක සඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ඇති ආයතනයේ තොරතුරු හා බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ආයතනයට සහකාර අධ්‍යක්ෂ තනතුරු 4ක්, ගණකාධිකාරී තනතුරු 01ක්, අධ්‍යයන හා පර්යේෂණ නිලධාරී තනතුරු 02ක්, සම්බන්ධිකරණ සහකාර තනතුරු 04ක්, පුස්තකාලයාධිපති තනතුරු 01ක්, කළමනාකාර සහකාර තනතුරු 03ක්, විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු තනතුරු 01ක් සහ රියදුරු තනතුරු 01ක් සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් විධිමත් පරිදි කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට හැකිවිය.



## 8.2 ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය

| තනතුරු නාමය | එකතුව |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. අධ්‍යක්ෂ | 02 |
| 3. සහකාර අධ්‍යක්ෂ | 03 |
| 4. ගණකාධිකාරී | 01 |
| 5. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 05 |
| 6. පරිපාලන නිලධාරී | 01 |
| 7. අභ්‍යන්තර විගණන නිලධාරි | 01 |
| 8. සම්බන්ධීකරණ සහකාර | 08 |
| 9. පුස්තකාලයාධිපති | 01 |
| 10. කළමනාකරණ සහකාර | 08 |
| 11. විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු | 01 |
| 12. රියදුරු | 05 |
| 13. කාර්යාල කාර්ය සහායක | 04 |
| **මුළු එකතුව** | 41 |

ඉහත තනතුරු ප්‍රමාණය අනුමත කිරීමෙන් අනතුරුව ආයතනයේ පහත දක්වා ඇති පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවන ලදී.

| තනතුරු නාමය | පුරප්පාඩු |
|---|---|
| 1. අධ්‍යක්ෂ | 01 |
| 2. සහකාර අධ්‍යක්ෂ | 01 |
| 3. ගණකාධිකාරී | 01 |
| 4. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 02 |
| 5. සම්බන්ධීකරණ සහකාර | 04 |
| 6. පුස්තකාලයාධිපති | 01 |
| 7. කළමනාකරණ සහකාර | 03 |

8. විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු 01
9. රියදුරු 01

<u>අධ්‍යක්ෂ තනතුරු (තනතුරු 01)</u>

ආයතනයේ අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පුහුණු) තනතුරට 2018 වර්ෂයේ දෙවරක් අයදුම්පත් කැඳවූ අතර ඒ සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කළ පුද්ගලයන්ගෙන් ඉල්ලුම් පත් ලැබී නොතිබූ බැවින් නැවත ඉල්ලුම් පත් කැඳවීමට කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරන ලදි.

<u>සහකාර අධ්‍යක්ෂ තනතුර (තනතුර 01)</u>

ඉහත තනතුරු සඳහා 2018 වර්ෂයේ අයදුම්පත් කැඳවූ අතර ඒ සඳහා සුදුසුකම් සම්පූර්ණ වූ පී.ජී.එස් පොතුපිටිය මහතා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය අනුව 2018 අගෝස්තු 01 වන දින සිට සහකාර අධ්‍යක්ෂ තනතුරට පත් කරන ලදි.

<u>ගණකාධිකාරී තනතුර (තනතුරු 01)</u>

මේ සඳහා පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයෙන් ඩී.එස්.ආර්.එම්.පී ගුණවර්ධන මහතා 2018 මැයි 02 වන දින රාජකාරි භාර ගන්නා ලදි.

<u>අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි තනතුර (තනතුරු 02)</u>

ඉහත තනතුර සඳහා කැඳවනු ලැබූ අයදුම්පත් අතරින් සුදුසුකම්ලත් අයදුම්කරුවන් දෙදෙනෙකු මෙම තනතුර සඳහා බඳවා ගන්නා ලදි. මේ අනුව තෝරා ගන්න ලද අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීන් වන එම්.එන්.එම්. මෆාස් මහතා (2018-10-01), එල්.එම්.ආර්.එන් ලංසකාර මෙනවිය (2018/10/01) එම තනතුරුවල රාජකාරි භාර ගන්නා ලදි.

සම්බන්ධීකරණ සහාකාර තනතුරුවල පුරප්පාඩු වූ තනතුරු සඳහා පහත නම් සඳහන් නිලධාරීන් බඳවා ගන්නා ලදි.

1. කේ.ඒ.එච් හිරෝෂිමා පෙරේරා මිය
2. එල්.කේ.වීබැද්ද මිය
3. ටී. කල්‍යාණි මෙය
4. සී.සී.ඩී.ද සිල්වා මහතා

පුස්තකාලය සඳහා පුස්තකාලයාධිපතිනිය ලෙස ඩී.සී. පුංචිහේවා මෙය 2018 අගෝස්තු 01 වන දින බඳවා ගන්නා ලදි. කළමනාකරණ සහකාර තනතුරුවල පුරප්පාඩු වූ තනතුරු 3ක් සඳහා පහත නම් සඳහන් නිලධාරීන් බඳවා ගන්නා ලදි.

1. ආර්.ඒ.ඩබ්.කේ ජයරත්න මහතා 2018-10-01
2. එම්.ජී.ආර්.එල්.ආර්. දිසානායක මහතා 2018-10-01
3. ඩී.කේ ප්‍රියන්ත මහතා 2018-10-01

විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු ලෙස ඕ.වී.එම්.චිත්‍රප්‍රිය මහතා 2018 ජූලි 20 වන දින බඳවා ගන්නා ලදි.

රියදුරු ලෙස එස්.පී.තුරම් මහතා 2018-අගෝස්තු 10 වන දින බඳවා ගන්නා ලදි.

මේ අනුව 2018 වර්ෂය අවසානයේදී ආයතනයේ සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| <u>තනතුරු නාමය</u> | <u>එකතුව</u> |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. අධ්‍යක්ෂ | 02 |
| 3. සහකාර අධ්‍යක්ෂ | 03 |
| 4. ගණකාධිකාරී | 01 |
| 5. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 05 |
| 6. පරිපාලන නිලධාරි | 01 |
| 7. අභ්‍යන්තර විගණන නිලධාරි | 01 |
| 8. සම්බන්ධීකරණ සහකාර | 08 |
| 9. කළමනාකරණ සහකාර | 08 |
| 10. රියදුරු | 03 |
| 11. කාර්යාල කාර්ය සහායක | <u>04</u> |
| **මුළු එකතුව** | **<u>36</u>** |

## 8.3 ආයතනයේ සංයුතිය

ආයතනයෙහි කාර්යයන් ඉටුකර ගැනීමේ පහසුව සඳහා පහත සඳහන් අංශවලට වෙන් කර ඇත.

1. පාලන හා සැපයුම් අංශය
2. පුහුණු අංශය
3. සැලසුම් හා පර්යේෂණ අංශය
4. අභ්‍යන්තර විගණන අංශය
5. ගිණුම් අංශය

## 8.4 පාලන හා සැපයුම් අංශය

ආයතනයේ කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පරිපාලන හා ආයතනික කටයුතු සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරයි. ආයතනයේ සෙසු අංශවල කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සපයා දෙමින්, අංශ අතර සම්බන්ධීකරණ කටයතු මනාව පවත්වාගෙන යාමද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

එසේම ආයතනයේ අනෙකුත් සියලුම අංශවලට අවශ්‍ය කාර්යමණ්ඩලය නියමිත කාර්ය පටිපාටින් ඔස්සේ බඳවා ගැනීම, ඔවුන්ගේ ආයතනික සහ පරිපාලනමය කටයුතු ඉටුකරමින් සේවක සුබසාධනයත්, සේවක අභිප්‍රේරණයත් නංවාලමින් ඒ ඒ අංශවල කටයුතු ඵලදායි අන්දමින් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැලසීමද පාලන අංශය මඟින් සිදු කරන කාර්යයකි.

පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ සහ ආයතනයේ සියලුම අංශවලට අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර මෙන්ම කාර්යාලයට දෛනික අවශ්‍ය වන කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීමටද, වාහන නඩත්තු, ප්‍රවාහන පහසුකම් සැපයීම, ආරක්ෂක සේවාවන් සහ පිරිසිදු කිරීමේ සේවා සම්පාදනය කිරීම ආදී සියලුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලබන්නේද මෙම අංශය විසිනි. එමෙන්ම ආයතනයේ පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානයද පරිපාලන අංශය යටතේ ක්‍රියාත්මක වේ.



**<u>පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය</u>**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය හා ඊට අනුබද්ධ පුහුණු ආයතනයේ පුහුණු පාඨමාලා පවත්වාගෙන යන සම්පත්දායකයන්ට, පුහුණු පාඨමාලා සඳහා සහභාගිවන්නන්ට සහ පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම සඳහා සහාය වන ආයතනයේ කාර්ය මණ්ඩලයට දැනුම සහ තොරතුරු රැස්කර ගැනීම සඳහා ඉගෙන ගැනීමේ පහසුකම් පුස්තකාලය මඟින් සපයා ගත හැකිය.

භාෂා පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා විශේෂයෙන් උපකාරී වන විශේෂ පොත්පත්වලින් පරිපූර්ණ වී ඇති මෙම පුස්තකාලය පරිපාලන කළමනාකරණය, ගිණුම්කරණය, තොරතුරු තාක්ෂණය, භාෂාව, සාහිත්‍යය සහ සමාජ විද්‍යාව ආදී විෂයන් ආශ්‍රිත පොත්පත් සහ සඟරාවලින් සමන්විත වේ.
මෙයට අමතරව මෙම පුස්තකාලය ජාතික භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය උපකාර ග්‍රන්ථ, ශබ්ධකෝෂ, විශ්වකෝෂ, පාරිභාෂික පදමාලා හා වාග්කෝෂ ආදී විමර්ශන කෘති, මෙන්ම පුහුණුවීම් සහ පුහුණු කිරීම්වලට අදාළ මෙවලම් කට්ටල, හා විවිධ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ එකතුවකින්ද යුක්ත වේ.
මේ හැර දෙවන භාෂාවක් අධ්‍යයනය කිරීමේදී අවශ්‍ය වන ග්‍රන්ථ හා විමර්ශන ද්‍රව්‍ය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක්ද මෙහි පවතී. චරිත ප්‍රධාන සහ අනුක්‍රමික සම්පාදනය මෙම පුස්තකාලය මඟින් ඉටු කරන තවත් සේවාවකි. මෙයට අමතරව භාෂාවලට අදාළ වූ කරුණු පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානයක් ලෙස විවිධ භාෂා පිළිබඳ ජාතික වශයෙන් සිදු කරන පර්යේෂණ සහ අධ්‍යයන සම්බන්ධයෙන් වූ පොත් එකතුවක්ද පුස්තකාලය සඳහා ලබාදී ඇත. 2018 වර්ෂයේ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ ඩී.සී.පුංචිහේවා මෙය ඉන් තේරී පත් වී පුස්තකාලයාධිපති වශයෙන් රාජකාරි සිදු කරමින් සිටී.

## 8.5 සැලසුම් අංශය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ සඳහන් අරමුණු සහ පරාමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඇතුළු සැලසුම් සකස් කිරීම, මාසික ප්‍රගති වාර්තා, කාර්තු ප්‍රගති වාර්තා, වර්ෂ අවසානයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කිරීම සහ එම වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

ඉහත කාර්යයන්ට අමතරව ආයතනය මඟින් හඳුන්වා දෙනු ලබන නව පාඨමාලාවන්ට අදාළ විෂයමාලා සහ මොඩියුල පිළියෙල කිරීමේ කටයුතු, මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

එසේම ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් අතරින් පහත වැඩසටහන් 2018 වර්ෂය තුළදී සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදි.

### දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

සිංහල, දෙමළ දෙවන  භාෂාවක් ලෙස ඉගැන්විය හැකි ගුරුවරුන් බිහිකිරීමේ පළමු අදියර ලෙස සහතික පත්‍ර පාඨමාලව ආරම්භ කර ඇත.

2015 සහ 2016 යන වර්ෂ 2ක තුළ පවත්වන ලද ඉහත පාඨමාලාවල අවසන් විභාගයෙන් සමත් පාඨමාලාලාභීන් සඳහා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 201-06-22 දින කොළඹ මිලෝදා, ඇකඩමියේදී, ගරු අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. පාඨමාලාලාභීන් 236 දෙනෙකු සඳහා මෙහිදී සහතික පත්‍ර ප්‍රදානය කරන ලද අතර **රු: 528,509.85ක** මුදලක් මේ සඳහා වැය විය. 2018 වර්ෂයේ සිංහල සහ දෙමළ මාධයෙන් මෙම වැඩසටහන් 2ක ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා පාඨමාලාලාභීන් **93** දෙනෙකු සහභාගී වී ඇත.

## 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා

| අනු අංකය | ස්ථානය | ආරම්භක දිනය | අවසාන දිනය | මාධ්‍යය | සහභාගීත්වය | වියදම (රු) |
|---|---|---|---|---|---|---|
| **1** | පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත | 13.08.2018 | 28.08.2018 | සිංහල | 55 | 685,791.33 |
| **විභාගය** | පරමධම්ම විහාරය පන්නිපිටිය | 20.09.2018 | 27.12.2018 | | | 33,990.00 |
| **2** | පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත | 12.12.2018 | 27.12.2018 | දෙමළ | 38 | 525,886.87 |
| මුළු එකතුව | | | | | | **1,245,668.20** |

## <u>ගුරුවරුන් සඳහා පසු විපරම් හා නියාමන වැඩසටහන්</u>

දෙවන භාෂා උගන්වන ගුරුවරුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව දින දෙකක වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2018 වර්ෂය තුළ පසු විපරම් හා නියාමන වැඩසටහන් 06ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රු: 455,204.60 ක මුදලක් වැය විය.

මේ සඳහා සම්පත්දායකින් 310 දෙදෙනෙකු සහභාගී වී ඇත.

## 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පසු විපරම් සහ නියාමන වැඩසටහන්

| වැඩසටහන් ගණන | ස්ථානය | ආරම්භක දිනය | අවසාන දිනය | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|---|
| 01 | පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත | 16.05.2018 | 17.05.2018 | 43 | 101,751.34 |
| 02 | ප්‍රධාන කාර්යාලය කොට්ටාව | 09.08.2018 | | 40 | 40,000.00 |
| 03 | උතුරු පළාත් මධ්‍යස්ථානය කිලිනොච්චිය | 20.08.2018 | 21.08.2018 | 33 | 89,472.00 |
| 04 | ප්‍රධාන කාර්යාලය කොට්ටාව | 03.09.2018 | | 101 | 82,696.93 |
| 05 | ප්‍රධාන කාර්යාලය කොට්ටාව | 17.09.2018 | | 56 | 63,211.00 |
| 06 | පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත | 27.09.2018 | 28.09.2018 | 37 | 78,073.33 |
| මුළු එකතුව | | | | **310** | **455,204.60** |

**පසු විපරම් හා අධීක්ෂණ සැසි**

2018 වර්ෂය තුළදී මෙම ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධව ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර, ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක නිලධාරින් හා ආයතනයේ ලියාපදිංචි ගුරුවරු දැනුවත් කිරීම සඳහා පළාත් මට්ටමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

| වැඩසටහන් ගණන | ස්ථානය | ආරම්භක දිනය | අවසාන දිනය | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|---|
| **01** | සුබෝධි ආයතනය පිළියන්දල | 09.10.2018 | | 45 | 97,842.00 |
| **02** | පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත | 17.11.2018 | 18.11.2108 | 64 | 102,320.00 |
| මුළු එකතුව | | | | **109** | **200,162.00** |

**<u>සැලසුම් සැසි</u>**

2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වලට අදාළව සහ එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මහාචාර්යවරුන්, ආචාර්යවරුන් සහ අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින් සමඟ විෂයමාලා ප්‍රවර්ධන සැසි පවත්වන ලදි.

2018 වර්ෂය තුළ මෙවැනි වැඩසටහන් **5ක්** ක්‍රියාත්මක කරන ලද අතර මෙ සඳහා රු**: 102,876.83**ක මුදලක් වැය වී ඇත.

| අනු අංකය | ස්ථානය | දිනය | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|
| **01** | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 22.02.2018 | 8 | 15,692.35 |
| **02** | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 09.08.2018 | 5 | 6,160.00 |
| **03** | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 03.09.2018 | 3 | 6,44.00 |
| **04** | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 17.09.2018 | 15 | 1320.00 |
| **05** | පුහුණු මධ්‍යස්ථානය, අගලවත්ත | 19&20.09.2018 | 6 | 79,059.50 |
| | **මුළු එකතුව** | | **37** | **102,876.83** |

## 8.6 පුහුණු අංශය

- **ගුරු පුහුණු වැඩසටහන්**

මඟින් දීප ව්‍යාප්තව සංවිධාන කරනු ලබන භාෂා පුහුණු පාඨමාලාවල ඉගැන්වීමට සුදුසුකම් ලබන්නේ දින 05ක නේවාසික ගුරු පුහුණු වැඩසටහනට සහභාගීවී ඉන් සමත්වන ගුරුවරුන් පමණි. මෙම ගුරුවරුන් හෘදයාංගමව බැඳුණු ආවර්ජිත සහභාගිත්ව ඉගැන්වීමේ ක්‍රියාවලිය (Participatory Reflective Heart Holding teaching Process) උපයෝගී කරගනිමින් ඉගැන්වීම් කටයුතුවල නිරත වේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට දෙවන භාෂාව ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීමත් සාමාන්‍ය ප්‍රජාවට භාෂා ප්‍රවීණතාවය ලබා දීමට හැකි ගුරු මණ්ඩලයක් බිහි කිරීමත් මෙවැනි වැඩසටහන් පැවැත්වීමෙහි අරමුණයි. මෙම වැඩසටහන සඳහා පාඨමාලාලාභීන්ගෙන් මුදල් අයකරනු ලබන අතර 2018 වර්ෂ තුළ මෙවැනි වැඩසටහන් **02**ක් පවත්වා ගුරුවරුන් **115** දෙනෙකු පුහුණු කර ඇත. මේ සඳහා රු: **586,7888.48**ක මුදලක් වැයවී ඇත.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද දින 05 ගුරු පුහුණු පාඨමාලා**

| අනු අංකය | ස්ථානය | ආරම්භක දිනය | අවසාන දිනය | සහාභාගිත්වය | ආදායම (රු) | වියදම (රු) |
|---|---|---|---|---|---|---|
| **01** | **පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත** | 04.04.2018 | 08.04.2018 | 46 | 345,000.00 | 238,966.03 |
| **02** | **පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත** | 19.10.2018 | 23.10.2018 | 69 | 517,500.00 | 347,822.45 |
| මුළු එකතුව | | | | **115** | **862,500.00** | **586,788.45** |

- **පුහුණුකරුවන් පුහුණු කිරීම**

ආයතනය මඟින් ක්‍රියාත්මක කරන භාෂා පුහුණු වැඩසටහන්වලට අදාළව සම්පත්දායකයන් පුහුණු කිරීමද, ආයතනය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව 2018 වර්ෂයේදී භාෂා පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාවට අදාළව පුහුණු කිරීමේ වැඩසටහනක් සහ ආයතනය මඟින් ආරම්භ කිරීමට නියමිත හින්දි භාෂා සහතික පත්‍ර පාඨමාලාවට අදාළ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහනක් මාකුඹුර පිහිටි ප්‍රධාන කාර්යාලයෙදී පවත්වන ලදි. මේ සඳහා රු**: 47,750.00**ක මුදලක් වැය කර ඇත.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන් | දිනය | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|
| **01** | භාෂා පරිවර්තන පාඨමාලාවට අදාළ පුහුණුකරුවන් පුහුණු කිරීම | 31.08.2018 | 8 | 35,603.00 |
| **02** | හින්දි භාෂා සහතිකපත්‍ර පාඨමාලාවට අදාළ පුහුණුකරුවන් පුහුණු කිරීම | 13.12.2018 | 6 | 12,147.00 |
| **මුළු එකතුව** | | | **14** | **47,750.00** |

- **<u>දින 12 (පැය 100) නේවාසික නොවන සිංහල / දෙමළ හා ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා</u>**

සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතාව උදෙසා මානව දයාවෙන් හා සහජීවනයෙන් පිරිපුන් රාජ්‍ය නිලධාරීන් නිර්මාණය කිරීමට ආයතනය ගන්නා අග්‍රගණ්‍ය උත්සහයක් ලෙස මෙම දින 12 කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලාව හැඳින්විය හැකිය. මෙම පාඨමාලාවට සම්බන්ධවන නිලධාරීන් දින 12ක් අඛණ්ඩව සහභාගීවිය යුතු අතර පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන විධිමත් ලිඛිත හා වාචික ඇගයීම මත සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 1/2014/1V මඟින් අවුරුදු 50ට වැඩි රාජ්‍ය නිලධාරින් මෙම ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පැය 100 පාඨමාලව හැදෑරීම මඟින් භාෂා ප්‍රවීණතා විභාගයෙන් නිදහස් වේ. ඒ අනුව 2018 වර්ෂය තුළ මෙම ආයතනය මඟින් පැය 100 පාඨමාලා 128ක් ක්‍රියාත්මක කරන ලදි. මින් පාඨමාලා 26ක් මුදල් අයකර ක්‍රියාත්මක කරන ලද අතර පාඨමාලා 77ක් අමාත්‍යාංශයේ අතිරේක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදි. එසේම දිවයින පුරා පවතින ඉල්ලීම් සලකා බලා අ.පො.ස, (උ.පෙළ) නිමකළ සිසුන් සඳහා ඉහත පැය 100 පාඨමාලා 25ක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි.



**2018 වර්ෂය තුළ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද දින 12 (පැය 100) භාෂා පුහුණු පාඨමාලා (දිස්ත්‍රික් මට්ටමින්)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා ගණන | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු) |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 4 | 218 | 303 ,534.00 |
| 2 | ගම්පහ | 4 | 269 | 358,591.00 |
| 3 | කළුතර | 10 | 866 | 860,650.40 |
| 4 | ගාල්ල | 9 | 753 | 920,899.20 |
| 5 | මාතර | 14 | 1287 | 960,263.20 |
| 6 | හම්බන්තොට | 5 | 566 | 221,714.00 |
| 7 | යාපනය | 6 | 421 | 1,202,037.96 |
| 8 | වව්නියාව | 4 | 357 | 313,318.00 |
| 9 | මඩකලපුව | 6 | 467 | 510,140.00 |
| 10 | ත්‍රිකුණාමලය | 4 | 273 | 273,614.00 |
| 11 | අම්පාර | 8 | 1,023 | 827,324.00 |
| 12 | මහනුවර | 8 | 685 | 697,904.00 |
| 13 | මාතලේ | 2 | 99 | 173,196.00 |
| 14 | අනුරාධපුරය | 12 | 1,192 | 1,094,700.40 |
| 15 | පොළොන්නරුව | 4 | 402 | 394,217.60 |
| 16 | කුරුණෑගල | 8 | 886 | 548,131.60 |
| 17 | පුත්තලම | 4 | 306 | 448,685.20 |
| 18 | බදුල්ල | 2 | 169 | 233,337.60 |
| 19 | මොනරාගල | 8 | 1135 | 973,180.40 |
| 20 | රත්නපුර | 7 | 885 | 835,340.80 |
| 21 | කෑගල්ල | 4 | 471 | 562,104.40 |
| මුළු එකතුව | | **133** | **12,758** | **13,175,502.96** |

- <u>**රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන දින 06 (පැය 50) නේවාසික නොවන සිංහල / දෙමළ භාෂා පුහුණු වැඩසටහන්**</u>

රාජ්‍ය ආයතනවල ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් මෙම ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පැය 50 පාඨමාලව හැදෑරීම මඟින් ඉහත විභාගයෙන් නිදහස් වේ.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද 1/2014 (IV) දරන චක්‍රලේඛනය මඟින් වයස අවුරුදු 50ට වැඩි සහ ප්‍රාථමික ශ්‍රේණියේ සියලු නිලධාරින් පැය 50ක භාෂා පුහුණු පාඨමාලාවක් හැදෑරීම මඟින් භාෂා ප්‍රවීණතා විභාගයෙන් නිදහස් වේ. ඒ අනුව 2018 වර්ෂය තුළදී මෙම පාඨමාලා 122ක් ක්‍රියාත්මක කරන ලද අතර මින් පාඨමාලා 31ක් අමාත්‍යාංශය වෙතින් ලද අතිරේක ප්‍රතිපාදන යටතේද පාඨමාලා 91ක් පාඨමාලාලාභීන්ගෙන් ගාස්තු අයකිරීමෙන්ද ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව IV වන මට්ටමේ වාරි ඉංජිනේරුවන් 104 දෙනෙකු සඳහාද වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් තුනෙන් රු: 80,623.70ක ලාභයක් ආයතනයට හිමි විය.

**2018 වර්ෂය තුළ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද දින 06 (පැය 50) භාෂා පුහුණු වැඩසටහන් (දිස්ත්‍රික් මට්ටමින්)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා ගණන | පාඨමාලාලභින් ගණන | වියදම (රු) |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 32 | 2,795 | 805,667.70 |
| 2 | ගම්පහ | 9 | 1153 | 448,077.00 |
| 3 | කළුතර | 05 | 339 | 110,471.96 |
| 4 | ගාල්ල | 2 | 109 | 102,004.20 |
| 5 | මාතර | 02 | 103 | 9,203.80 |
| 6 | හම්බන්තොට | 1 | 61 | 71,172.10 |
| 7 | යාපනය | 1 | 46 | 31,100.00 |
| 8 | වව්නියාව | 1 | 60 | 7,300.10 |
| 9 | මඩකලපුව | 6 | 314 | 127,474,30 |
| 10 | ත්‍රිකුණාමලය | 3 | 370 | 147,984.10 |
| 11 | අම්පාර | 9 | 1090 | 510,952.30 |
| 12 | මහනුවර | 4 | 239 | 118,739.20 |
| 13 | මාතලේ | 6 | 835 | 171,815.50 |
| 14 | අනුරාධපුරය | 07 | 475 | 146,577.60 |
| 15 | පොළොන්නරුව | 4 | 503 | 235,674.20 |
| 16 | කුරුණෑගල | 11 | 1334 | 269,051.10 |
| 17 | පුත්තලම | 1 | 51 | 42,177.10 |
| 18 | බදුල්ල | 19 | 1988 | 1,227,883.20 |
| 19 | මොනරාගල | 4 | 346 | 250,248.40 |
| 20 | රත්නපුර | 9 | 874 | 510,556.90 |
| 21 | කෑගල්ල | 4 | 329 | 300,304.30 |
| | මුළු එකතුව | **140** | **13,414** | **5,662,435.06** |

- **<u>උසස් පෙළ සිසුන් සඳහා දෙවන භාෂා කඳවුරු</u>**

  අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් දරු දැරියන්ට සිංහල,දෙමළ භාෂා ඉගෙන ගැනීම කෙරෙහි උනන්දුවක් ඇති කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. දින 2ක් තුළදී පළාත් මට්ටමින් මෙම භාෂා කඳවුරු ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා ආයතනයේ පුහුණුව ලද විශේෂ ගුරු මණ්ඩලයක් විසින් සම්පත්දායකත්වය සපයන ලදි.

  2018 වර්ෂය තුළදී මෙම වැඩසටහන් 6ක් ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා රු: **2,229,582.00**ක මුදලක් වැය විය.

**2018 වර්ෂය තුළ උසස් පෙළ සිසුන් සඳහා භාෂා කඳවුරු ක්‍රියාත්මක කරන ලද පාඨමාලා**

| අනු අංකය | ස්ථානය | කාලය | මාධ්‍ය | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|---|
| | | | | | |
| **බස්නාහිර පළාත - කොළඹ දිස්ත්‍රික්කය** | | | | | |
| **1** | මුත්තුවෙල් හින්දු විද්‍යාලය | 27/10.2018 | සිංහල / දෙමළ | 80 | 104,775.00 |
| **නැගෙනහිර පළාත - මඩකලපු දිස්ත්‍රික්කය** | | | | | |
| **2** | පට්ටිපොලෙ විද්‍යාලය | 16/17.06.2018 | සිංහල | 391 | 237,900.00 |
| **3** | නාවක්කාඩු නාමහල් විද්‍යාලය | 15/16.09.2018 | සිංහල | 140 | 187,605.00 |
| **4** | ආරයම්පති RMK විද්‍යාලය | 23/24.11.2018 | සිංහල | 552 | 510,052.00 |
| **5** | හින්දු විද්‍යාලය මඩකලපුව | 22/23.12.2018 | සිංහල | 1163 | 810,414.00 |
| **නැගෙනහිර පළාත - කිළිනොච්චි දිස්ත්‍රික්කය** | | | | | |
| **6** | ධර්මපුර විද්‍යාලය | 28/29.07.2018 | සිංහල | 230 | 378,836.00 |
| **මුළු එකතුව** | | | | **2,556** | **2,229,582.00** |

- **<u>“දන්නවා නම් උගන්වන්න, දන්නැත්නම් ඉගෙනගන්න” ගුවන් විදුලි වැඩසටහන</u>**

අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා ඉලක්ක කර ගනිමින් 2016 වර්ෂය තුළදී ආරම්භ කරන ලද මෙම වැඩසටහන 2018 වර්ෂය තුළදීද ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල සහ දෙමළ සේවය ඇතුළුව ප්‍රාදේශීය සේවා 09ක් ඔස්සේ වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය මල්ලිකා දේවනාරායන මහත්මියගේ සම්පත්දායකත්වය ලබා ගන්නා ලදි. මෙම වැඩසටහන සඳහා ප්‍රචාරණ වියදම් ඇතුළුව 2018 වර්ෂය තුළදී රු **8,345,874.96**ක මුදලක් වැය කර ඇත.

- **<u>“දන්නවා නම් උගන්වන්න, දන්නැත්නම් ඉගනගන්න” ගුවන් විදුලි වැඩසටහනට සමගාමීව පවත්වන ලද අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා සම්මන්ත්‍රණ මාලාව</u>**

මෙම ආයතනය, ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය සමඟ එක්ව 2018 වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා සඳහා පෙනී සිටින දරු දැරියන්ට එක් දිනක විශේෂ සම්මන්ත්‍රණ මාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි.

මෙම සම්මන්ත්‍රණ මාලාව සඳහා ගුරුඅත්පොත් සහ සිසුන් සඳහා පුනරීක්ෂණ අත්පොත් පිළියෙලකොට මුද්‍රණය කිරීම ආයතනය විසින් සිදුකරන ලදි. මේ සඳහා අදාළ විශේෂඥයන්ගේ සහ ආයතනයෙහි අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීන්ගේ සම්පූර්ණ දායකත්වය ලබාගන්නා අතර, මෙම කාර්යයටද රු: 1,475,00.00ක මුදලක් වැය විය.

සම්මන්ත්‍රණ මාලාව සඳහා ආයතනයේ ලියාපදිංචි ගුරුවරුන් අතරින් විශේෂ කණ්ඩායමක් යොදවා ගන්නා ලද අතර ඔවුන්ට අධ්‍යයන මණ්ඩලය මගින් විශේෂ ගුරු පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

මුළු දිවනයිනම ආවරණය වන පරිදි ලැබී ඇති ඉල්ලීම් සලකා බලා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර සිංහල මාධ්‍ය සම්මන්ත්‍රණ මාලා **13**ක්ද දෙමළ මාධ්‍ය සම්මන්ත්‍රණ මාලා **23**ක්ද ක්‍රියාත්මක කරන ලදි.

## 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අ.පො.ස.(සා.පෙළ) දෙවන භාෂා සම්මන්ත්‍රණ මාලාව (දිස්ත්‍රික් මට්ටමින්)

| අනු අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා ගණන | | පාඨමාලාලාභීන් ගණන | | වියදම (රු) |
|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | |
| 1 | කොළඹ | 1 | 1 | 200 | 150 | 67,512.00 |
| 2 | ගම්පහ | - | 3 | - | 509 | 143,566.00 |
| 3 | කළුතර | - | 4 | - | 636 | 120,888.00 |
| 4 | ගාල්ල | - | 2 | - | 239 | 61,584.00 |
| 5 | මාතර | 1 | 2 | 325 | 558 | 142,734.00 |
| 6 | හම්බන්තොට | - | 2 | - | 367 | 90,700.00 |
| 7 | යාපනය | - | - | - | - | - |
| 8 | කිළිනොච්චි | - | - | - | - | - |
| 9 | මුලතිව් | - | - | - | - | - |
| 10 | මන්නාරම | - | - | - | - | - |
| 11 | වවුනියාව | - | - | - | - | - |
| 12 | මඩකලපුව | - | - | - | - | - |
| 13 | ත්‍රිකුණාමලය | 1 | - | 59 | - | 7,800.00 |
| 14 | අම්පාර | 1 | - | 116 | - | 22,800.00 |
| 15 | නුවර | 1 | 1 | 91 | 122 | 62,080.00 |
| 16 | මාතලේ | 1 | - | 178 | - | 31,140.00 |
| 17 | නුවරඑළිය | 1 | - | 124 | - | 16,900.00 |
| 18 | අනුරාධපුරය | 1 | 1 | 60 | 60 | 39,596.00 |
| 19 | පොළොන්නරුව | 1 | 2 | 130 | 203 | 125,374.50 |
| 20 | කුරුණෑගල | 1 | - | 130 | - | 27,875.00 |
| 21 | පුත්තලම | - | - | - | - | - |
| 22 | බදුල්ල | 2 | 1 | 550 | 250 | 216,480.00 |
| 23 | මොනරාගල | 1 | 2 | 154 | 259 | 140,822.00 |
| 24 | රත්නපුර | - | 2 | - | 440 | 122,096.00 |
| 25 | කෑගල්ල | - | 2 | - | 440 | 122,096.00 |
| මුළු එකතුව | | **13** | **23** | **2,117** | **3,793** | **1,439,947.50** |

- **<u>පිළිගැනීමේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන භාෂා පුහුණු පාඨමාලා</u>**

සියලුම අමාත්‍යාංශ හා ඒවාට අනුබද්ධිත ආයතනවල රාජකාරියේ නියුතු පිළිගැනීමේ නිලධාරීන් මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කරන ලෙස ලිඛිතව දැනුවත් කරන ලදි.

ඒ අනුව මෙම නිලධාරීන්ට කුණ්ඩසාලේ ජාතිය ගොඩනගන්නන්ගේ සංගමයට අයත් පුහුණු මධ්‍යස්ථානයේදී නේවාසික පාඨමාලා ලෙස වැඩසටහන් දෙකක් පවත්වන ලදි. මේ සඳහා රු **1,559,658.32**ක මුදලක් වැය වු අතර අමාත්‍යාංශයේ අතිරේඛ ප්‍රතිපාදන මඟින් වියදම් ආවරණය කර ගන්නා ලදි.

| අනු අංකය | ස්ථානය | ආරම්භක දිනය | අවසන් දිනය | පාඨමාලාලාභින් ගණන | වියදම (රු) |
|---|---|---|---|---|---|
| **01** | ජාතිය ගොඩනගන්නන්ගේ සංගමය | 29.11.2018 | 10.12.2018 | 24 | 833,930.12 |
| **02** | ජාතිය ගොඩනගන්නන්ගේ සංගමය | 17.11.2018 | 28.11.2018 | 19 | 725,728.20 |
| මුළු වියදම | | | | | **1,559,658.32** |



- **<u>භාෂා පරිවර්තන සහතික පත්‍ර පාඨමාලාව</u>**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනත යටතේ භාෂා හා භාෂණ පරිවර්තක පුහුණු කිරීම මෙම ආයතනයේ ප්‍රධාන වගකීමක් වේ.

ඒ අනුව 2018-09-23 දින මාකුඹුර පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පාඨමාලාලාභීන් 21දෙනෙකු සඳහා මෙම පාඨමාලාව ආරම්භ කරන ලද අතර එක් පාඨමාලාලාභියකුගෙන් රු:20,000ක පාඨමාලා ගාස්තුවක් අය කරන ලදි. කැළණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අංශයේ හිටපු මහාචාර්ය අශෝක ප්‍රේමරත්න මහතා මෙහි සම්බන්ධිකරණ කටයුතු සිදු කරන අතර භාෂා පරිවර්තන ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණයන් විසින් මේ සඳහා සම්පත්දයකත්වය සපයනු ලබයි.

- **<u>දෙවන භාෂා ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලව</u>**

දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරූ පාඨමාලාලාභීන් සඳහා මෙම ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වේ. ඒ අනුව 2018 වර්ෂය තුළ මෙම පාඨමාලාව සඳහා 24දෙනෙකු ලියාපදිංචි වූ අතර එක් අයකුගෙන් රු: 20,000ක ගාස්තුවක් අයකෙරේ.

- **<u>විවිධ වෘත්තිකයන් සඳහා පවත්වනු ලබන පැය 150 භාෂා පුහුණු පාඨමාලා</u>**

ඒ අනුව විවිධ ක්ෂේත්‍රයන්හි සේවයේ නියතු වෘත්තිකයන් ඉලක්ක කරගෙන මෙම පාඨමාලව නේවාසිකව ක්‍රියාත්මක කෙරේ. මෙහිදී විශේෂයෙන්ම අලුතින් පත්වීම් ලබන වෛද්‍ය නිලධාරීන්, ඉංජිනේරුවන්, රේගු නිලධාරීන් හා ශිල්පීය නිලධාරීන් ප්‍රධාන වේ.

**2018 වර්ෂය තුළ වෘත්තිකයන් සඳහා ක්‍රියාත්මක කරන ලද පැය 100 සිංහල / දෙමළ නේවාසික භාෂා පුහුණු පාඨමාලා**

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | සහභාගිත්වය | ආදායම (රු) | වියදම (රු) | ලාභය (රු) |
|---|---|---|---|---|---|---|
| **1** | වෛද්‍ය නිලධාරීන් සඳහා (අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය) | 13 | 926 | 16,668,000.00 | 10,789,021.18 | 5,878,978.82 |
| **2** | වාරි ඉංජිනේරුවන් සඳහා (අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය) | 2 | 131 | 2,358,000.00 | 1,713,647.85 | 644,352.15 |
| **3** | විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහ (අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය) | 1 | 81 | 1,458,000.00 | 961,703.86 | 496,296.14 |
| **4** | රේගු නිලධාරීන් සඳහා (ආයතනයේ පුහුණු මධ්‍යස්ථානයෙන් බැහැරව) | 5 | 446 | 530,000.00 | 54,196.50 | 475,803.50 |
| **5** | අධ්‍යාපන පරිපාලන නිලධාරීන් සඳහා (ප්‍රධාන කාර්යාලය-කොට්ටාව) | 1 | 53 | 530,000.00 | 91,439.00 | 438,561.00 |
| **6** | වාරි ඉංජිනේරුවන් සඳහා (ආයතනයේ පුහුණු මධ්‍යස්ථානයෙන් බැහැරව) | 3 | 144 | 225,000.00 | 35,281.80 | 189,718.20 |
| | **මුළු එකතුව** | **26** | **1781** | **21,769,000.00** | **13,645,290.19** | **8,123,709.81** |

- **<u>ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක නිලධාරීන් සඳහා පවත්වනු ලබන භාෂා පුහුණු පාඨමාලා</u>**

  අමාත්‍යාංශයට අනුබද්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ඉහත නිලධාරීන් සඳහා 2018 වර්ෂය තුළ මෙම ආයතනය විසින් සිංහල සහ දෙමළ භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව මෙම වර්ෂය තුළදී ඉහත නිලධාරීන් කණ්ඩායම් දෙකකට වැඩසටහන් 3 බැගින් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා අවශ්‍ය විෂය නිර්දේශ සහ මොඩියුල පිළියෙල කිරීම සහ ගුරුවරුන් පුහුණු කිරීම සහ ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදුවිය.

**2018 වර්ෂය තුළ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක නිලධාරීන් සඳහා පවත්වනු ලබන භාෂා පුහුණු පාඨමාලා**

| වැඩසටහන | ස්ථානය | කාල සීමාව | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|
| **සම්පත්දායකයන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම** | | | | 48,.878.75 |
| **පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන** | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 30.05.2018 | 27 | 387,327.00 |
| **1 කණ්ඩායම 1 වැඩසටහන** | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය බගවන්තලාව | 25.06.2018-06.07.2018 | 53 | 2,192573.25 |
| **11 කණ්ඩායම 1 වැඩසටහන** | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය අතුරුගිරිය | 07.08.2018-18.08.2018 | 76 | 3,148,713.31 |
| **1 කණ්ඩායම 11 වැඩසටහන** | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය අතුරුගිරිය | 24.08.2018-04.09.2018 | 41 | 2,006,648.14 |
| **11 කණ්ඩායම 11 වැඩසටහන** | සුබෝධි ආයතනය පිළියන්දල | 01.10.2018-13.10.2018 | 60 | 2,509,116.14 |
| **1 කණ්ඩායම 111 වැඩසටහන** | සුබෝධි ආයතනය පිළියන්දල | 02.12.2018-13.12.2018 | 32 | 1,361,711.35 |
| **11 කණ්ඩායම 11 වැඩසටහන** | පුහුණු මධ්‍යස්ථානය අගලවත්ත | 10.12.2018-21.12.2018 | 51 | 1,890,141.63 |
| මුළු එකතුව | | | | **13,545,109.57** |

- <u>උතුරු පළාත් මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්</u>

  අමාත්‍යාංශය මඟින් 2018-07-30 දින කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ උතුරු පළාත් මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර මෙම ආයතනය මඟින් එම මධ්‍යස්ථානය තුළ භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් 606 දෙනෙකු සඳහා (සිංහල නිලධාරීන් 228 දෙනෙක් සහ දෙමළ නිලධාරීන් 378 දෙනෙක් සඳහා) පාඨමාලා 16ක් (සිංහල පාඨමාලා 10ක් සහ පාඨමාලා දෙමළ 6ක්) ක්‍රියාත්මක කරන ලද අතර තරුණ තරුණියන් 219 දෙනෙකු සඳහා පාඨමාලා 5ක් ක්‍රියාත්මක කරන ලදි. මීට අදාළ සම්පූර්ණ වියදම අමාත්‍යාංශය මඟින් දරන ලදි.

- <u>බලයලත් ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්</u>

මෙම ආයතනය මඟින් බලයලත් ආයතන ලෙස ඔරියන්ට් ආයතනය මඟින් 2018 වර්ෂය තුළදී රාජ්‍ය නිලධාරීන් සඳහා පහත පරිදි පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරන ලදි. මෙම පාඨමාලා තුළින් ලැබෙන ආදායමින් 15% ක් ආයතනයට ලාභය ලෙස ලබාදී ඇත.

| පාඨමාලා වර්ගය | වැඩසටහන් ගණන | පාඨමාලාලාභීන් ගණන | පාඨමාලා ආදායම 15% |
|---|---|---|---|
| **දින 06 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා** | 41 | 2719 | 1203921 |
| **දින 18 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා** | 55 | 3276 | 3478596 |

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**සාරාංශගත පුහුණු වාර්තාව - දෙමළ භාෂාව**

| අනු අංකය | ස්ථානය | වැඩසටහන් වර්ගය | කාල සීමාව | | සහභාගිත්වය |
|---|---|---|---|---|---|
| | | | ආරම්භක දිනය | අවසාන දිනය | |
| 1 | සෞඛ්‍ය අමාත්‍යාංශය. | දින 6 | 2018.03.22 | 2018.04.09 | 77 |
| 2 | වෛද්‍ය පර්යේෂණ ආයතනය, බොරැල්ල. | දින 18 | 2018.02.27 | 2018.05.31 | 53 |
| 3 | වෛද්‍ය පර්යේෂණ ආයතනය, බොරැල්ල. | දින 18 | 2018.05.09 | 2018.05.31 | 56 |
| 4 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 18 | 2018.04.25 | 2018.05.24 | 59 |
| 5 | ඔරියන්ට් ඇකඩමි, කුරුණෑගල | දින 18 | 2018.04.26 | 2018.05.25 | 63 |
| 6 | ශික්ෂණ රෝහල, අනුරාධපුර | දින 18 | 2018.04.24 | 2018.05.24 | 57 |
| 7 | කාර්මික විද්‍යාලය, ගාල්ල. | දින 18 | 2018.04.25 | 2018.05.24 | 51 |
| 8 | හෙද විද්‍යාලය, කළුතර. | දින 18 | 2018.03.19 | 2018.05.10 | 53 |
| 9 | මූලික රෝහල, මුල්ලේරියාව. | දින 6 | 2018.06.29 | 2018.07.08 | 50 |
| 10 | සෞඛ්‍ය අමාත්‍යාංශය. | දින 6 | 2018.06.30 | 2018.07.10 | 32 |
| 11 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 6 | 2018.06.11 | 2018.06.25 | 41 |
| 12 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 6 | 2018.06.18 | 2018.06.25 | 27 |
| 13 | සෞඛ්‍ය අමාත්‍යාංශය. | දින 6 | 2018.07.27 | 2018.08.05 | 39 |
| 14 | ශික්ෂණ රෝහල, කළුබෝවිල | දින 6 | 2018.07.16 | 2018.08.09 | 27 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, අංගොඩ. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 34 |
| 16 | මූලික රෝහල, බලපිටිය. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 75 |
| 17 | සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය, හම්බන්තොට. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 48 |
| 18 | මූලික රෝහල, වතුපිටිවල. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 36 |
| 19 | ද සොයිසා කාන්තා රෝහල. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 39 |
| 20 | ජාතික සෞඛ්‍ය වෛද්‍ය ආයතනය, කළුතර. | දින 18 | 2018.07.16 | 2018.08.08 | 35 |
| 21 | මහ රෝහල, , කොළඹ. | දින 18 | 2018.08.08 | 2018.08.13 | 50 |
| 22 | දිස්ත්‍රික් රෝහල, නාගොඩ. | දින 18 | 2018.07.16 | 2018.08.13 | 58 |
| 23 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.07.16 | 2018.08.13 | 60 |
| 24 | මහ රෝහල, බදුල්ල. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 59 |
| 25 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 18 | 2018.07.16 | 2018.08.09 | 59 |
| 26 | ජාතික සෞඛ්‍ය ආයතනය, කළුතර. | දින 18 | 2018.07.16 | 2018.08.08 | 86 |
| 27 | ශික්ෂණ රෝහල, මඩකලපුව. | දින 18 | 2018.07.26 | 2018.08.21 | 30 |
| 28 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.08.15 | 2018.08.20 | 53 |
| 29 | මූලික රෝහල, මුල්ලේරියාව. | දින 06 | 2018.08.04 | 2018.08.13 | 55 |
| 30 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.08.22 | 2018.08.28 | 55 |
| 31 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.08.29 | 2018.09.04 | 52 |
| 32 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.09.05 | 2018.09.10 | 79 |
| 33 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල . | දින 06 | 2018.09.05 | 2018.09.10 | 50 |
| 34 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.09.12 | 2018.09.18 | 88 |
| 35 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.09.19 | 2018.09.24 | 77 |
| 36 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.09.26 | 2018.10.01 | 65 |
| 37 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල | දින 18 | 2018.09.12 | 2018.10.01 | 56 |
| 38 | මහ රෝහල, කෑගල්ල | දින 18 | 2018.09.07 | 2018.10.02 | 66 |
| 39 | ශික්ෂණ රෝහල, මහනුවර. | දින 18 | 2018.09.05 | 2018.09.29 | 81 |
| 40 | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව, | දින 18 | 2018.09.06 | 2018.10.02 | 54 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පේරාදෙණිය. | | | | |
| 41 | නව දිස්ත්‍රික් රෝහල, මාතර. | දින 18 | 2018.09.12 | 2018.10.05 | 86 |
| 42 | මූලික රෝහල, ගම්පොළ. | දින 18 | 2018.09.10 | 2018.10.01 | 31 |
| 43 | ශික්ෂණ රෝහල, කුරුණෑගල. | දින 18 | 2018.09.13 | 2018.10.09 | 37 |
| 44 | මහ රෝහල, කුලියාපිටිය. | දින 18 | 2018.09.13 | 2018.10.09 | 35 |
| 45 | දඹදෙණිය. | දින 18 | 2018.09.17 | 2018.10.08 | 34 |
| 46 | සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය, මාවනැල්ල. | දින 18 | 2018.09.07 | 2018.10.02 | 46 |
| 47 | මූලික රෝහල, වරකාපොල. | දින 18 | 2018.09.07 | 2018.10.03 | 34 |
| 48 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.09.14 | 2018.10.05 | 65 |
| 49 | මහ රෝහල, කඹුරුපිටිය. | දින 18 | 2018.09.12 | 2018.10.10 | 43 |
| 50 | මහ රෝහල, කොළඹ. | දින 18 | 2018.09.03 | 2018.09.27 | 78 |
| 51 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.10.03 | 2018.10.08 | 79 |
| 52 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 18 | 2018.10.04 | 2018.10.26 | 58 |
| 53 | මූලික රෝහල, දඹදෙණිය. | දින 18 | 2018.10.15 | 2018.11.05 | 42 |
| 54 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.10.08 | 2018.10.28 | 58 |
| 55 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 06 | 2018.10.13 | 2018.10.19 | 61 |
| 56 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 06 | 2018.10.23 | 2018.10.28 | 64 |
| 57 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 06 | 2018.11.08 | 2018.11.13 | 47 |
| 58 | ජාතික සෞඛ්‍ය වෛද්‍ය ආයතනය, කළුතර. | දින 06 | 2018.10.20 | 2018.10.29 | 46 |
| 59 | ශික්ෂණ රෝහල, මහනුවර. | දින 06 | 2018.11.05 | 2018.11.10 | 108 |
| 60 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.10.10 | 2018.10.15 | 80 |
| 61 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.10.17 | 2018.10.22 | 87 |
| 62 | මහ රෝහල කොළඹ. | දින 06 | 2018.10.24 | 2018.10.29 | 75 |
| 63 | මහ රෝහල, කුලියාපිටිය. | දින 18 | 2018.10.16 | 2018.11.12 | 30 |
| 64 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.10.30 | 2018.10.21 | 75 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 65 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.10.25 | 2018.11.19 | 100 |
| 66 | මහ රෝහල, කොළඹ. | දින 18 | 2018.10.09 | 2018.11.02 | 69 |
| 67 | කාසල් වීදිය, කාන්තා රෝහල, කොළඹ. | දින 18 | 2018.10.29 | 2018.11.21 | 75 |
| 68 | ශික්ෂණ රෝහල, කොළඹ. | දින 06 | 2018.11.18 | 2018.11.24 | 85 |
| 69 | ශික්ෂණ රෝහල, කොළඹ. | දින 06 | 2018.11.25 | 2018.12.01 | 89 |
| 70 | සැපයුම් අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය. | දින 06 | 2018.10.29 | 2018.10.03 | 33 |
| 71 | සැපයුම් අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය. | දින 06 | 2018.11.15 | 2018.11.20 | 41 |
| 72 | මහ රෝහල, අම්පාර. | දින 06 | 2018.11.12 | 2018.11.30 | 83 |
| 73 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.10.31 | 2018.11.07 | 84 |
| 74 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.11.08 | 2018.11.13 | 120 |
| 75 | මහ රෝහල, කොළඹ. | දින 06 | 2018.11.15 | 2018.11.21 | 135 |
| 76 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 06 | 2018.12.02 | 2018.12.07 | 41 |
| 77 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 06 | 2018.12.08 | 2018.12.13 | 36 |
| 78 | මහ රෝහල, කොළඹ. | දින 18 | 2018.11.12 | 2018.12.07 | 77 |
| 79 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 18 | 2018.10.27 | 2018.11.19 | 59 |
| 80 | ශික්ෂණ රෝහල, මහනුවර. | දින 18 | 2018.11.21 | 2018.12.18 | 109 |
| 81 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.11.23 | 2018.12.13 | 88 |
| 82 | ජෛව වෛද්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය. | දින 18 | 2018.11.27 | 2018.12.20 | 32 |
| 83 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 06 | 2018.11.21 | 2018.11.27 | 49 |
| 84 | ශික්ෂණ රෝහල, මහනුවර. | දින 06 | 2018.12.05 | 2018.12.10 | 106 |
| 85 | මූලික රෝහල, ගල්ගමුව. | දින 18 | 2018.11.28 | 2018.12.21 | 40 |
| 86 | මහ රෝහල, කොළඹ. | දින 18 | 2018.12.10 | 2019.01.03 | 86 |
| 87 | ශික්ෂණ රෝහල, කුරුණෑගල. | දින 18 | 2018.12.10 | 2019.01.01 | 69 |
| 88 | ප්‍රාදේශීය කාර්යාලය, තඹුත්තේගම. | දින 18 | 2018.12.03 | 2018.12.23 | 57 |
| 89 | නාගොඩ රෝහල, කළුතර. | දින 18 | 2018.12.07 | 2018.12.24 | 58 |
| 90 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 18 | 2018.11.26 | 2018.12.20 | 60 |
| 91 | මහ රෝහල, අම්පාර. | දින 18 | 2018.12.03 | 2018.12.20 | 116 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 92 | මූලික රෝහල, කන්තලේ. | දින 06 | 2018.12.17 | 2018.12.23 | 38 |
| 93 | මූලික රෝහල, කන්තලේ. | දින 06 | 2018.12.26 | 2019.01.03 | 43 |
| 94 | ශික්ෂණ රෝහල, මහනුවර | දින 06 | 2018.12.17 | 2018.12.22 | 104 |
| 95 | ශික්ෂණ රෝහල, මහනුවර | දින 06 | 2018.12.26 | 2018.12.31 | 50 |
| 96 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 06 | 2018.12.10 | 2018.12.15 | 67 |
| 97 | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල. | දින 06 | 2018.12.27 | 2019.01.03 | 63 |
| 98 | ශික්ෂණ රෝහල, අනුරාධපුරය. | දින 18 | 2018.12.14 | 2019.01.05 | 70 |
| 99 | හෙද විද්‍යාලය, කළුතර. | දින 18 | 2018.12.05 | 2018.12.25 | 154 |
| 100 | ශික්ෂණ රෝහල, කාරපිටිය. | දින 18 | 2018.12.13 | 2018.12.31 | 85 |
| 101 | දිස්ත්‍රික් රෝහල, මොණරාගල. | දින 18 | 2018.12.26 | 2019.01.14 | 65 |
| 102 | ජාතික අක්ෂි රෝහල, කොළඹ. | දින 06 | 2018.12.17 | 2018.12.22 | 71 |

## රාජ්‍ය ආයතනවල සහයෝගයෙන් පවත්වන ලද අර්ධකාලීන සහ පූර්ණකාලීන පාඨමාලා

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | සහභාගිත්වය |
|---|---|---|---|
| **1** | 1,2,3,4 මට්ටමේ නිලධාරීන් සඳහා පවත්වන ලද අර්ධකාලීන පාඨමාලා | 2 | 71 |
| **2** | පැය 50 පාඨමාලා (දෙමළ) | 6 | 348 |
| **3** | පැය 150 පාඨමාලා (දෙමළ) | 1 | 70 |
| **4** | පැය 15 පාඨමාලා (දෙමළ) | 1 | 300 |
| | **මුළු එකතුව** | **10** | **859** |

## 8.7 අභ්‍යන්තර විගණන අංශය

### හැඳින්වීම

අභ්‍යන්තර විගණන ඒකකය ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතු නියම වශයෙන්ම කරගෙන යන්නාවූ නොහොත් ඒ කටයුතු සඳහා වගකීමට බැඳී ඇත්තාවූ අයගේ මෙන්ම යෝජනා ක්‍රමවල හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හෝ ආයතනය තුළ වැඩ හෝ සේවා ඉටුකිරීමෙහි හෝ නියුක්ත වූ අයගේද පාලනයෙන් නිදහස්ව වෙනමම ස්වාධීන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ.

මුදල් හා ගිණුම්කරණ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය ඍජුවම ආයතන ප්‍රධානියා වෙත වාර්තා කිරීම අත්‍යවශ්‍ය වේ.

අභ්‍යන්තර විගණන ඒකකයේ ව්‍යාපෘති සහ යෝජනා සම්බන්ධයෙන් විගණන කටයුතු අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව සිදුවන අතර ආයතනයේ මුදල් කටයුතුවලට අදාළ අංග සමීක්ෂණයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර ඒ අනුව කටයුතු කරනු ලබයි.

### අභ්‍යන්තර විගණන ඒකකයේ පරමාර්ථ

- ආයතනයේ මුදල් කටයුතු පිළිබඳ පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගිවී එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණයට භාවිත කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් පවත්වාගෙන යාම.
- ආයතනය මඟින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාත්මක කිරීමෙහිලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට සහය වීම.

### අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්යයන් සහ ඒවායේ විෂය සීමාව

- වැරදි සහ වංචා වැළැක්වීම සඳහා ආයතනය තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි සහ පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරීත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.
- ගිණුම් සහ වෙනත් වාර්තාවල විශ්වසනීයත්වය නිශ්චය කිරීම සහ යොදාගෙන ඇති ගිණුම්කරණ පිළිවෙත මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයට පවරාදී ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්යසාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.
- ආයතනය සතු වත්කම් සියලුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.
- රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ වරින්වර නිකුත් කරනු ලබන ආයතනයට අදාළ චක්‍රලේඛනවල උපදෙස් පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

- නාස්තිය, නිෂ්කාර්ය ධාරිතාවය සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කරගැනීමට තෝරාගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.
- අවශ්‍ය අවස්ථාවන්හි විශේෂ විමර්ශන පැවැත්වීම.
- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ටි කෝණයෙන් පරිබාහිරව කළමනාකරණ දෘෂ්ටි කෝණයකින් ආයතනයේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම හා ඒ පිළිබඳ වාර්තා කිරීම.
- වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඒ පිළිබඳ වැඩසටහන් හා කාලසටහන් කොතෙක් දුරට ඉලක්ක සාක්ෂාත් කිරීම කෙරෙහි යොමුවන්නේ දැයි සොයා බැලීම.

## අභ්‍යන්තර විගණන සැලැස්ම

ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ප්‍රධාන ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන්ට අදාළව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන වැඩසටහන

ආයතනයේ මුදල් කටයුතු පිළිබඳ ක්‍රමවත් වූද, ප්‍රමාණවත් වූද, කාර්යක්ෂම වූද ද පරීක්ෂාවක් කිරීමට හැකිවනු පිණිස ආයතනයේ මූල්‍යමය කටයුතුවලට අදාළ අංග සමීක්ෂණයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම

අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරනුයේ ආයතනයේ සභාපතිවරයාටය. එම වාර්තාවල පිටපත් විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

## 2018 අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කරන ලද ක්ෂේත්‍ර

- භාෂා පුහුණු පාඨමාලා විගණනය
- ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් ප්‍රසම්පාදන කටයුතු
- ධාරිතා වර්ධන වැඩසටහන්
- ආදායම් උත්පාදක වැඩසටහන්
- පුනරාවර්තන වියදම්
- ප්‍රාග්ධන වියදම්
- කාර්යමණ්ඩලයේ නිවාඩු

## අවදානම් කළමනාකරණය

### ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ හැඳින්වීම

සෑම ආයතනයක්ම විවිධ අවදානම්වලට මුහුණ දෙමින් සිටි. මෙම අවදානම් කළමනාකරණය කළ යුතු අතර, ඒවා හොඳින් කළමනාකරණය කළහොත්, ඒ සඳහා උපරිම විභවතාවයක් ඇති වීමටත් හේතු වනවා ඇත.

මෙම අවදානම් මූලිකව මෙහෙයුම් සහ මූල්‍ය අවදානම් යටතේ වර්ග කළ හැකිය. මෙම අවදානම් වර්ගවල සාරාංශ, එක් එක් බාණ්ඩය යටතේ එන විශේෂිත අවදානම් අංශ සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග පහත වගුවේ දක්වා ඇත

| අනු අංකය | අවදානම් සාධක | ප්‍රතිඵල | අවදානම් අගය කිරීම |
|---|---|---|---|
| **1** | විභාග සැපයුම්, ප්‍රමිතින් සපුරාලීමට අසමත් වීම. | විභාගයේ ශිෂ්‍ය කාර්යසාධනය නොගැළපීම | විභාග කටයුතු පිළිබඳ අධීක්ෂණය |
| **2** | අතාත්වික මානව සම්පත් ප්‍රවේශය | ඉගැන්වීම් කටයුතුවල ගුණාත්මකභාවය අඩු වීම. | සම්පත්දායකයින්ගේ සුදුසුකම් සමාලෝචනය කිරීම. |
| **3** | මූල්‍ය අවදානම | දුර්වල මූල්‍ය කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය මඟින් මූල්‍ය වගකීම සපුරා ගැනීමට සහ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වීම, වංචා සොරකම් අතිරේක වියදම් වැඩි වීම. | ආදායම් මූලාශ්‍ර ඇති කිරීම, අයවැය පාලනය කිරීම, මෙහෙයුම් සමාලෝචනය |
| **4** | තොරතුරු පද්ධති යාවත්කාලීන නොවීම | තොරතුරු පද්ධතිවලට බාධා පැමිණීම, නිවැරදි සහ සම්පූර්ණ තොරතුරු ලබා දීමට අසමත් වීම. සහාය සේවාවන්ට බාධා පැමිණීම | තොරතුරු පද්ධතිය වර්තමාන සහ අනාගත අවශ්‍යතාව පිළිබඳ නිරතුරුව සමාලෝචනය කිරීම. |
| **5** | පරිපාලන කටයුතු විධිමත් නොවීම. | වාහන නඩත්තුව, කාර්ය මණ්ඩල නිවාඩු, ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් බාධා පැමිණීම. | අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අධීක්ෂණය කර නිර්දේශ සහිත වාර්තා සැපයීම. |

## අභ්‍යන්තර පාලනය

ආයතනයේ අභ්‍යන්තර විගණන පද්ධතියේ කාර්යක්ෂමතාවය අභ්‍යන්තර විගණන විසින් සහ බාහිර විගණන විසින් සපයන ලද වාර්තා මඟින් ඇගයීමට ලක් කරනු ලැබේ.




## විගණන හා කළමනාකරණ කමිටු

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛන අංක 55 (PED) අනුව කාර්තුවකට එක් රැස්වීම බැගින් වර්ෂයකට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

## 8.8 ගිණුම් අංශය

ආයතනයේ සියලුම මුල්‍ය පාලන සහ ගිණුම් කටයුතු සිදු කිරීම ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ආයතනයේ ප්‍රධාන මුල්‍ය විධායකයා අධ්‍යක්ෂ ජනරාල් වන අතර ගණකාධිකාරී විසින් මුල්‍ය කටයුතු ගිණුම් කටයුතු පිළිබඳ වගකීම දරනු ලබයි.

**ගිණුම් අංශයේ කාර්යයන්**

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට හා ගණන්දීමේ නිලධාරී ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට මුල්‍ය බැඳීම ඉටු කරලීමට සහ පාර්ලිමේතුව වෙත වගවීම දැරීමට සහාය වීම.

- රජයේ මුල්‍ය නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.
- මුල්‍ය කළමනාකරණය ගිණුම්කරණ පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම.
- අයවැය පුරෝකථනය/ මුල්‍ය සැලසුම් සකස් කිරීම හා යාවත්කාලින කිරීම.
- කාලීන හා නිවැරදි මුල්‍ය වාර්තා පවත්වාගෙන යාම.
  වර්ෂ අවසාන ගිණුම් සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
- බදු ප්‍රතිපත්තිවලට හා අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම.
- නිසි වේලාවට සේවක වැටුප් හා වේතන ගෙවීම
- ආයතනයේ පවත්වනු ලබන පාඨමාලාවල මුල්‍ය කටයුතු මෙහෙය වීම හා අවශ්‍ය මුල්‍ය පහසුකම් සම්පාදනය කර දීම.

## (1) ගිණුම්කරණ ප්‍රතිපත්ති

### (1.1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලබන අතර සුදුසු පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් යටතේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිද යොදාගෙන ඇත.

### (1.2) සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර අවබෝධ කර ගැනීමට අදාළව අවශ්‍ය වන පෙර වර්ෂවල සංසන්දනාත්මක තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

### (1.3) දේපළ, පිරියත, හා උපකරණ

දේපළ, පිරියත, හා යන්ත්‍රෝපකරණවල අගය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය වටිනාකම් අඩුකළ පසු අගයෙන්, වඩා අඩු අගයකට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මෙම වත්කම්වල පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම්, ඒවායේ ඵලදායී ජීවකාලය තුළ සමානුපාතිකව බෙදීයන පරිදි පහත සඳහන් ක්ෂය අනුපාත මත ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

| | අනුපාතය (%) |
|---|---|
| **ගොඩනැගිලි හා ඉදිකිරීම්** | **2.5** |
| **ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ** | **10** |
| **යන්ත්‍ර සූත්‍ර, පිරියත හා උපකරණ** | **20** |
| **වාහන** | **25** |
| **පරිගණක** | **25** |
| **පුස්තකාල පොත්** | **10** |

2014 වර්ෂය දක්වා අදාළ වත්කම් මිලදී ගත් වර්ෂයේදී එම සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය වෙන් කරන එම වත්කම් ඉවත් කිරීමේදී ඉවත් කරන සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන් කිරීම සිදු නොකරනු ලබයි. 2014 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් මිලදී ගත් / ඉවත් කළ දිනය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

**(1.4) පාරිතෝෂික සඳහා වෙන් කිරීම**

සේවකයකු සේවයට බඳවා ගත් දින සිට සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ සියලුම සේවා භවතුන්ගේ පෙර ගිණුම් වර්ෂයේ අවසාන මාසයේදී ලබාගත් මාසික වැටුපෙන් භාගයකට සමාන වටිනාකම පදනම් කරගෙන පාරිතෝෂික මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික මුදල් ගෙවීමට බැඳීමක් ඇති වන්නේ අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයත් සම්පූර්ණ කළ සේවකයකු සේවයෙන් ඉවත්වීමේදීය.

**(1.5) ලැබිය යුතු ශේෂ**

ලැබිය යුතු ගිණුම් ශේෂ, අපේක්ෂිත උපලබ්දි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ගිණුම් වර්ෂ අවසානයේදී ලැබිය යුතු ගිණුම් ශේෂවලින් උපලබ්ධි වීම අනපේක්ෂිත අගයන් පුරෝකථනය කරනු ලබයි. බොල් ණය ලෙස හඳුනා ගන්නා ණය ගැති ශේෂ එසේ හඳුනා ගත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම කරනු ලබයි.

**(1.6) මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, අතැති මුදල්, බැංකු තැම්පතු, බැංකු අයිරා වටිනාකම් යන දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා වටිනාකම් පෙන්නුම් කරනු ලබයි.

**(1.7) ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂපත්‍ර දිනට පසු සිදුවී ඇති සිදුවීම්වලින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇතිකරන සිද්ධීන්වල බලපෑම මූල්‍ය ප්‍රකාශනවල අදාළ පරිදි ගැළපීම් කර ඇති අතර ඇතැම් සිදුවීම් හෙළිදරව් කිරීම් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දක්වා ඇත.

**(1.8) බැරකම් වෙනුවෙන් වෙන් කිරීම**

මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කරන දින වන විට නිශ්චිතව ගණනය කළ හැකි සියලු බැරකම් අගය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර වටිනාකම නිශ්චිතව නිර්ණය කළ නොහැකි බැරකම් වෙනුවෙන් අවශ්‍ය පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

**(1.9) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල වෙනුවෙන් වෙන් කිරීම.**

සේවක හවතුන්හට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල් වෙනුවෙන් හිමිකමක් ඇති අතර පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් හා 3% ලෙස ආයතනය විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

### (1.10) ආදායම

#### 1.10.1 පුනරාවර්ථන ආදායම ලෙස ලැබෙන රාජ්‍ය ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලැබෙන ප්‍රදාන ආයතනයේ ආදායමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර, ආයතනයේ සියලු ආදායම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ.

#### 1.10.2 ප්‍රාග්ධන හා ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා දෙන ප්‍රදාන මෙහි ඇතුළත් වන අතර, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මෙමඟින් සිදු කරනු ලබයි.

### (1.11) වියදම්

ආයතනය දෛනික කටයුතු පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන පුනරාවර්ථන වියදම් හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වෙනුවෙන් අදාළ වර්ෂයේදී දරන ලද සියලු වියදම් මේ යටතේ පෙන්නුම් කෙරේ.

### (1.12) තොග

පාඨමාලාවලට අදාළ පොත්පත්, ලිපි ද්‍රව්‍ය ඇතුළු සියලුම තොග අගයන් පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

## (2) මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්

2.1.1 2014 වර්ෂය දක්වා ක්ෂය කිරීමේදී අනුගමනය කළ මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන්කිරීමේ හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී එම ඉවත් කරන සම්පූර්ණ වර්ෂයටම ක්ෂය වෙන් නොකිරීමේ ප්‍රතිපත්තිය 2014 වර්ෂයෙන් පසු අදාළ වත්කම් මිලට ගත් දිනය හෝ ඉවත් කළ දිනය සලකා ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය දක්වා වෙනස් කර ඇත.

## (3) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී "වක්‍ර ක්‍රමය" අනුගමනය කරන අතර මුදල් හා මුදල් සමාන දෑ තුළ බැංකු ශේෂ / අයිරා වටිනාකම්ද ඇතුළත් කර ඇත.

## 2018-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන්

| සටහන් 01 - ආදායම | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|
| අයහාර වියදම් සඳහා ප්‍රදාන | **55,993,810** | 46,677,322 |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන- | | |
| පුහුණු පාඨමාලා සඳහා | | |
| මහා භාණ්ඩාගාරයේ ලැබීම් | **31,546,000** | 13,114,071 |
| රේඛිය අමාත්‍යාංශයෙන් ලැබීම් | **49,887,161** | 5,000,000 |
| | **137,426,971** | 64,791,393 |

| සටහන් 02 - වෙනත් ආදායම් | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|
| පුහුණු පාඨමාලා ආදායම් | **42,727,270** | 16,247,694 |
| ලියාපදිංචි ගාස්තු | **60,000** | - |
| විභාග ගාස්තු | **46,000** | - |
| ටෙන්ඩර් තැම්පතු - ආපසු නොගවන | **116,000** | 30,500 |
| පොළී ආදායම | **803,260** | 378,610 |
| වැටුප් රහිත නිවාඩු හා වැටුපෙන් අඩු කිරීම | **133,634** | 11,782 |
| ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවෙන් ලද ආදායම | **186,000** | 180,500 |
| වාහන දීමනා මත රජයේ ගාස්තු | **4,200** | 10,200 |
| ශාලා ගාස්තු | **10,000** | - |
| නිවාස පහසුකම් මත රජයේ ගාස්තු 10% | **50,136** | 43,314 |
| සන්නිවේදන | **-** | 6,991 |
| අයි වෙන්කිරීම් | **-** | 2,850 |
| විදුලි බිල්පත් මත රජයේ ගාස්තු | **6,000** | 6,000 |
| විවිධ ආදායම් | **201,598** | - |
| | **44,344,097** | 16,918,441 |

**සටහන් 03 - පරිපාලන වියදම්**

| | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|
| **සේවක සංවේතන** | | |
| වැටුප් හා වේතන | **16,296,094** | 15,949,321 |
| සේ.අ.අ 12% | **1,921,377** | 1,924,169 |
| සේ.භා.අ 3% | **480,344** | 481,042 |
| අතිකාල | **153,186** | 105,878 |
| නිවාඩු දින දීමනා | **45,808** | 23,846 |
| වෘත්තීය දීමනා | **168,000** | - |
| අනෙකුත් දීමනා | **338,775** | - |
| වාහන දීමනා | **600,000** | |
| ඉන්ධන දීමනා | **654,170** | 439,960 |
| පුහුණුවන්නන් සඳහා දීමනා | **345,225** | 155,500 |
| සහභාගිත්ව හා ප්‍රවාහන දීමනා | **809,687** | 1,000,000 |
| සභාපති දීමනා | **902,248** | 861,800 |
| පාරිතෝෂික වියදම් | **354,841** | 801,410 |
| ප්‍රවාහන - දේශීය | **110,950** | 68,152 |
| ප්‍රවාහන - විදේශීය | - | 1,334,161 |

| | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|
| **සැපයුම්** | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය ද්‍රව්‍ය | **470,044** | 609,514 |
| ඉන්ධන | **484,940** | 249,015 |
| නිල ඇඳුම් | **10,675** | 47,200 |
| සංග්‍රහ වියදම් | **287,740** | 134,611 |
| පුවත්පත් හා වෙනත් | **-** | 8,320 |

| | | |
|---|---|---|
| **නඩත්තු වියදම්** | | |
| වාහන | **1,024,354** | 2,258,723 |
| | | |
| දේපළ හා පිරියත | **173,350** | 199,721 |
| පරිගණක | **10,350** | 41,980 |
| ගොඩනැගිලි | **147,205** | 125,000 |
| කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | **420** | - |
| | | |
| **සේවා** | | |
| ප්‍රවාහන | **44,149** | 186,134 |
| තැපැල් හා සන්නිවේදන | **733,425** | 671,443 |
| ජලය හා විදුලිය | **1,006,277** | 1,224,908 |
| | | |
| බදු සහ කුලී වියදම් | **17,212,500** | 23,909,800 |
| ආරක්ෂණ සේවා | **2,584,510** | 1,229,108 |
| පවිත්‍රතා සේවා | **2,777,174** | 2,468,980 |
| වෙළඳ ප්‍රචාරණ | **800,820** | 505,955 |
| මෙහෙයුම් කල්බදු | **3,863,762** | 3,427,604 |
| විගණන ගාස්තු | **-** | 355,635 |
| | | |
| වෙනත් | **820,458** | - |
| **ක්ෂය** | | |
| දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ | **2,085,860** | 1,677,928 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | **492,544** | 489,625 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | **1,015,436** | 869,519 |
| වාහන | **5,512,500** | 5,075,000 |
| පුස්තකාල පොත් | **68,587** | 133,335 |
| පරිගණක | **503,460** | 1,589,327 |
| | **65,311,243** | 70,633,624 |

| | | |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | **2,180,435** | 2,955,886 |
| තැපැල් හා සන්නිවේදන | **943,566** | 2,777,866 |
| ආහාර හා සංග්‍රහ කටයුතු | **21,168,481** | 14,063,245 |
| නවාතැන් පහසුකම් | **5,443,524** | 738,747 |
| සම්පත්දායක දීමනා | **21,522,250** | 20,265,575 |
| පර්යේෂණ වියදම් | **-** | 1,491,000 |
| සහතිකපත් මුද්‍රණ ගාස්තු | **3,753,753** | 3,910,415 |
| සහයක සේවා | **392,058** | 344,350 |
| අතිකාල දීමනා | **814,107** | 968,313 |
| නිවාඩු දින දීමනා | **307,656** | 266,140 |
| ඉන්ධන | **1,577,937** | 1,911,838 |
| අතිරේඛ ඉන්ධන | **-** | 16,731 |
| | | 480,107 |
| විදුලිය | **1,331,021** | |
| වතුර | **302,740** | 184,760 |
| වෙනත් සේවා | **118,570** | 2,287,972 |
| ගමන් වියදම් - දේශීය | **571,284** | 509,905 |
| වාහන නඩත්තු | **146,631** | 361,370 |
| යන්ත්‍රෝපකරණ හා පිරියත නඩත්තු වියදම් | **40,275** | 61,133 |
| ලී බඩු උපකරණ නඩත්තු | **10,400** | 2,950 |
| සහභාගීත්ව දීමනා | **682,810** | 326,020 |
| ගුවන් විදුලි වැඩසටහන් හා තාක්ෂණික ගාස්තු | **9,937,082** | 8,414,505 |
| ප්‍රවාහන | **94,670** | 849,481 |
| සේවක මණ්ඩල පුහුණු | **466,050** | 612,965 |
| දැන්වීම් ගාස්තු | **1,647,997** | 845,585 |

| සටහන් 04 - පුහුණු වැඩසටහන් සඳහා යන වියදම් | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| ගොඩනැගිලි නඩත්තු | **99,738** | 11,480 |
| නේවාසිකාගාර අවශ්‍යතා | **36,660** | 58,845 |
| ශාලා ගාස්තු | **1,963,672** | 329,775 |
| වැටුප් හා වේතන | | 177,485 |
| බැංකු ගාස්තු | **37,760** | - |
| පරිවර්තන හා විභාග ගාස්තු | **17,500** | - |
| | **75,608,626** | 65,224,443 |

| සටහන් 05 - වෙනත් වියදම් | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| විවිධ වියදම් | - | 756,658 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ අලාභ | - | 4,836,301 |
| | - | 5,592,959 |

| සටහන් 06 - මූල්‍ය වියදම් | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| බැංකු ගාස්තු | **7,610** | 30,780 |
| ඉතුරුම් පොළී මත රඳවා ගැනීමේ බදු | **46,904** | 37,861 |
| | **54,514** | 68,641 |

**සටහන 07 -**
**දේපළ පිරියත හා උපකරණ**

| | ක්ෂය අනුපාතය | මුළු පිරිවැය 2017 | වර්ෂය තුළ ඉවත් කිරීම් | ගැළපීම් | මුළු පිරිවැය 2018.12.31 | සමුච්චිත ක්ෂය | ගැළපීම් | වර්ෂය සඳහා ක්ෂය | සමුච්චිත ක්ෂය වෙනස් කිරීම් 2017.12.31 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) |
| ඉඩම් | - | 615,000 | - | 615,000 | - | - | - | - | 615,000 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 2.50% | 19,585,000 | - | 20,986,199 | 665,353 | - | 492,544 | 1,157,897 | 19,828,302 |
| යන්ත්‍ර සූත්‍ර පිරියත හා උපකරණ | 20% | 10,365,658 | - | 10,620,221 | 6,414,470 | - | 2,085,860 | 8,500,330 | 2,119,891 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% | 9,501,661 | (64,780) | 12,226,740 | 5,709,799 | (64,780) | 1,015,436 | 6,660,455 | 5,566,285 |
| වාහන | 25% | 22,050,000 | - | 22,050,000 | 7,466,506 | - | 5,512,500 | 12,979,006 | 9,070,994 |
| පුස්තකාල පොත් | 10% | 1,333,352 | - | 1,343,352 | 1,264,848 | - | 68,587 | 1,333,435 | 9,917 |
| පරිගණක | 25% | 6,849,114 | - | 8,052,639 | 6,688,074 | (1,240,908) | 503,460 | 5,950,626 | 2,102,013 |
| | | 70,299,784 | - | 75,894,151 | 28,209,050 | (1,305,688) | 9,678,387 | 36,581,749 | 39,312,402 |

| සටහන් 08 - දේපළ හා වෙනත් ලැබිය යුතු ශේෂ | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|
| අත්තිකාරම් ප්‍රාග්ධනය | **100,000** | - |
| හේවාසිංහ මහතාගෙන් ලැබිය යුතු ශේෂ | **58,983** | 58,983 |
| ප්‍රදීප් කුමාර මහතාගෙන් ලැබිය යුතු ශේෂ | **19,898** | 19,898 |
| තුරම් මහතාගෙන් ලැබිය යුතු ශේෂ | **17,163** | - |
| නාපාවල මහත්මියගෙන් ලැබිය යුතු ශේෂ | **9,650** | 9,650 |
| වික්‍රමසිංහ මහතාගෙන් ලැබිය යුතු ශේෂ | **9,650** | 9,650 |
| ෆොස්ටියර් ඉඩස්ට්‍රීස්(පුද්) සමගම. | | 278,100 |
| තැම්පතු | **141,500** | 141,500 |
| බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | **165,000** | 165,000 |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | **8,378,000** | 5,750,000 |
| රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | **14,201,683** | - |
| | **23,101,527** | 6,432,781 |

| සටහන් 09 - මුදල් හා මුදල් සමාන දෑ | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| ලංකා බැංකු ගිණුම් අංක – 0007442918 | | |
| ප්‍රාග්ධන | 643,419 | 5,943,390 |
| පුනරාවර්ථන | 2,562,518 | 1,611,215 |
| අමාත්‍යාංශ වැඩසටහන් | 478,150 | - |
| ආදායම | (7,291,582) | 3,282 |
| ඉතිරි කිරීමේ ගිණුම - 79712746 | 35,711,789 | 11,883,533 |
| | 32,104,294 | 19,441,420 |

| සටහන් 10 - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| ටෙන්ඩර් තැම්පතු - ආපසු ගෙවිය යුතු | 262,000 | 212,000 |
| සම්පත්දායක දීමනා | 12,676,670 | 12,197,890 |
| ඉන්ධන | 201,000 | 626,039 |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 76,660 | 1,117,586 |
| ආහාර සහ සංග්‍රහ ගාස්තු | 1,108,051 | 1,825,932 |
| ප්‍රවාහන | - | 652,350 |
| වාහන නඩත්තු | - | 20,506 |
| නවාතැන් ගාස්තු | 2,050,882 | 349,630 |
| තැපැල්/කුරිය හා සන්නිවේදන | - | 852,986 |
| ගමන් වියදම් - දේශීය | 40,808 | 13,988 |
| අතිකාල | - | 205,064 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 40,424 | - |
| අත්පොත් මුද්‍රණය | | 3,568,715 |
| පර්යේෂණ වියදම් | | 745,500 |
| වික්‍රමාරච්චි කන්ස්ට්‍රක්ෂන් අගලවත්ත කාර්යාලය අලුත්වැඩියා | 637,946 | 2,111,345 |

| | | |
|---|---|---|
| විදේශ ගමන් වියදම් - අරුණ දේවරාජා මහතා | | 48,050 |
| ගෙවිය යුතු මුද්දර බදු | **11,125** | |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | **70,674** | |
| ලිමා ක්‍රියේෂන් - අභ්‍යන්තර සැකසීම් | **5,585,155** | |
| ඉන්දියානු මහකොමසාරිස් කාර්යාල ගාස්තු | | 13,916 |
| වෙනත් | **17,500** | 1,965,223 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | **620,190** | 620,190 |
| ශ්‍රී ලංකා විදුලි සංස්ථාව හා ලක්දිත් ඇඩ්වටයිසින් | **731,789** | 735,308 |
| වැටුප්, සේ.අ.අ.හා සේ.හා. මණ්ඩල සඳහා වෙන් කිරීම් | **335,577** | 1,984,735 |
| | **24,466,451** | 29,866,953 |

| සටහන් 11 - උපචිත වියදම් | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| දේශීය ගමන් ගාස්තු | **1,226** | 1,557 |
| තැපැල් හා සන්නිවේදන | **179,759** | 30,959 |
| විදුලිය | **179,964** | 22,606 |
| ආරක්ෂණ සේවා | **-** | 293,000 |
| ශාලා ගාස්තු හා ශබ්දවිකාශන | **62,000** | - |
| අතිකාල | **787** | 2,650 |
| නිවාඩු දීමනා | **6,305** | 1,567 |
| ජල වියදම් | **2,924** | - |
| පවිත්‍රතා වියදම් | **20,800** | - |
| දැන්වීම් ගාස්තු | **105,628** | 60,000 |
| වාහන නඩත්තු | - | 77,126 |
| ගොඩනැගිලි නඩත්තු | - | 125,000 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | **226,521** | - |
| | **785,913** | 614,465 |

| සටහන් 12 - පෙර වර්ෂයේ ගැළපිලි | 2018 |
|---|---|
| | (රු) |
| පරිගණක සමුච්චිත ක්ෂය අධි වෙන් කිරීම් | **1,240,907** |
| උපචිත බිල්පත් අධි වෙන් කිරීම් | **5,243,274** |
| වැඩ තහනම් කළ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරිවරයාට අදාළ වෙන් කිරීම් | **1,649,158** |
| | **8,133,339** |

**සටහන 13 - හේවාසිංහ මහතා සම්බන්ධ නඩු කටයුතු**

රජයේ මුදල් අයථා භාවිතය හා කූට ලේඛන ඉදිරිපත් කිරීම හේතුවෙන් සහකාර අධ්‍යක්ෂකවරයකු 2010 පෙබරවාරි 02 වන දින සිට සේවයෙන් පහ කර ඇති අතර ඊට අදාළව කඩුවෙල අධිකරණයේ නඩුවක් 2011 වර්ෂයේ සිට විභාග වෙමින් පවතී. (නඩු අංක: LT/30/1491/2011)

**සටහන 14 – 2015, 2016 හා 2017 කාල පරිච්ඡේද තුළ වැඩ තහනම් කරන ලද නිලධාරීන්**

2015.03.19 දින සිට 2015.07.06 වන දින දක්වා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවය අත්හිටුවා ඇති අතර 2015.08.10 වන දින සිට අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීවරයකුගේ වැඩ තහනම් කර ඇත. 2018-09-23 දින පැවති කළමනාකරණ මණ්ඩල තීරණය අනුව ඉහත සඳහන් කර ඇති අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීවරයාගේ සේවය අවසන් කර ඇති අතර වැටුප්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් වෙන් කිරීම් ශේෂය තුළ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉහත කාලසීමාවට අදාළ වෙන් කිරීම් ඇතුළත් වේ.

**සටහන 15 - ඉදිකරමින් පවතින ගොඩනැගිලි**

අගලවත්ත පුහුණු මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු 2018-12-22 දින අවසන් කර ඇති අතර ගෙවිය යුතු ශේෂය ලෙස දැක්වෙන **රු:637,945.78ක්** මහින්ද ඉහත නවීකරණ කටයුතු අතරමඟ නවතා දැමූ වික්‍රමාරච්චි ක්‍රන්ස්ට්‍රක්ෂන් ආයතනය මඟින් සිදු කළ වැඩ වටිනාකම පෙන්නුම් කෙරේ.

**සටහන 16 - අතිරේක අයවැය ප්‍රතිපාදන මඟින් සිදු කළ වැඩසටහන්වල පියවිය යුතු බිල්පත්**

රේඛීය අමාත්‍යාංශය හරහා 2018-09-06 දින **රු: මි27.5ක** අයවැය ඇස්තමේන්තුවක් ලද අතර **රු:14,201,683.05ක** මුදල මඟින් ඉහත ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්වලට අදාළව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු වටිනාකම පෙන්නුම් කෙරේ.

**සටහන 17 - ආයතනයේ නිල වෙබ් අඩවිය සකස් කිරීම**

ආයතනයේ වෙබ් අඩවිය නිර්මාණය කිරීම ආරම්භ කර ඇති අතර මේ සඳහා 2018 ක්‍රියාකාරී සැලැස්ම තුළ **රු:600,000.00ක** මුදලක් වෙන් කර ඇත.

**2018.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| සටහන | | **2018** (රු) | **2017** (රු) |
|---|---|---|---|
| ආදායම | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 01 | **87,539,810** | 59,791,393 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 01 | **49,887,161** | 5,000,000 |
| වෙනත් ආදායම් | 02 | **44,344,097** | 16,918,441 |
| | | **181,771,068** | 81,709,834 |
| වියදම් | 03 | **(65,311,243)** | (70,633,623) |
| පරිපාලන වියදම් | | | |
| පුහුණු වැඩසටහන් සඳහා වියදම් | 04 | **(75,608,626)** | (65,224,443) |
| වෙනත් වියදම් | 05 | **-** | (5,592,959) |
| මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය (ඌනතාවය) | | **40,851,199** | (59,741,191) |
| මූල්‍ය වියදම් | 06 | **(54,514)** | (53,641) |
| බදු පෙර අතිරික්තය / (ඌනතාවය) | | **40,796,685** | (59,809,832) |
| බදු | | | |
| බදු පසු අතිරික්තය (ඌනතාවය) | | **40,796,685** | (59,809,832) |

## 2018-12-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| සටහන | | 2018 (රු) | 2017 (රු) |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 07 | **39,312,402** | 42,090,735 |
| ගොඩනැගිලි - කෙරී ගෙන යන වැඩ | | **11,986,375** | 2,111,345 |
| ජංගම වත්කම් | | | |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු වටිනාකම් | 08 | **23,101,527** | 6,432,781 |
| තොග- ලිපි ද්‍රව්‍ය හා පරිභෝජන භාණ්ඩ | | **1,249,058** | 982,660 |
| මුදල් හා මුදල් සමාන දෑ | 09 | **32,104,294** | 19,441,420 |
| | | **56,454,878** | 26,856,861 |
| මුළු වත්කම් | | **107,753,655** | 71,058,940 |
| අරමුදල්, සංචිත හා වගකීම් | | | |
| ප්‍රාග්ධනය | | **13,015,468** | 13,015,468 |
| සමුච්චිත අතිරික්තය/ඌනතාවය | | **41,495,192** | (7,434,842) |
| ප්‍රත්‍යාගණ සංචිත | | **32,526,407** | 32,526,407 |
| | | **87,037,066** | 38,107,032 |
| ජංගම නොවන වත්කම් | | | |

| | | | |
|---|---|---|---|
| පාරිතෝෂික වෙන්කිරීම් | | | |
| | | **2,724,222** | 2,470,481 |
| | | **2,724,222** | 2,470,481 |
| ජංගම බැරකම් | | | |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 10 | 24,466,451 | 29,866,951 |
| උපචිත වියදම් | 11 | 785,913 | 614,465 |
| | | 25,252,363 | 30,481,416 |
| මුළු අරමුදල් සහ බැරකම් | | 115,013,651 | 71,058,929 |

## 2018-12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

| | දායක ප්‍රාග්ධන (රු) | සමුච්චිත අතිරික්තය (ඌනතාවය) (රු) | ප්‍රත්‍යාගණන සංචිත (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | **13,015,468** | **19,147,625** | **-** | **32,163,093** |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | - | 2,563,353 | | 2,563,353 |
| | - | - | | - |
| වර්ෂයේ අතිරික්තය / ඌනතාවය | - | 23,080,772 | | 23,080,772 |
| පෙර වර්ෂයේ ගැළපිලි | | (20,966,327) | | (20,966,327) |
| බඹරවානගේ මහතාගේ වෙන් කිරීම් | | | | |
| වත්කම් ප්‍රකාශය | | 15,136 | | 15,136 |
| වත්කම් ප්‍රත්‍යාගණය | | | 32,526,407 | 32,526,407 |
| 2016-01-31 දිනට ශේෂය | **13,015,468** | **23,840,559** | **32,526,47** | **69,382,434** |

| | | | | |
|---|---|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | | 21,534,441 | | 21,534,441 |
| අමාත්‍යාංශයේ ප්‍රදාන ලෙස ලද වාහන | | 7,000,000 | | 7,000,000 |
| වර්ෂයේ අතිරික්තය / (ඌනතාවයව) | | (59,809,832) | | (59,809,832) |
| පෙර වර්ෂ ගැළපිලි | | | | |
| **2017-12-31 දිනට ශේෂය** | **13,015,468** | **(7,434,832)** | **32,526,407** | **38,107,043** |
| පෙර වර්ෂයේ ගැළපිලි | | 8,133,339 | | 8,133,339 |
| වර්ෂයේ අතිරික්තය / (ඌනතාවයව) | | 40,796,685 | | 40,796,685 |
| **2018-12-31 දිනට ශේෂය** | **13,015,468** | **41,495,192** | **32,526,407** | **87,037,066** |

## 2018-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහන ප්‍රකාශය

| | 2018 | 2017 |
|---|---|---|
| | (රු) | (රු) |
| බදු පෙර අතිරික්තය / ඌනතාවය | **40,796,685** | (59,809,832) |
| වත්කම් ඉවත්කිරීමෙන් ලද අලාභය | **-** | 4,836,301 |
| මුල්‍ය නොවන විචල්‍යයන් සඳහා ගැළපීම් | | |
| ක්ෂය | **9,678,387** | 9,834,734 |
| පෙර වර්ෂයේ ගැළපිලි | **6,892,431** | (19,997,192) |
| පාරිතෝෂික වියදම් | **354,841** | 801,410 |
| වෙනත් ආදායම් | **-** | (1,129,659) |
| කලින් ගෙවීම් සඳහා ගැළපීම | **-** | 10,999,967 |
| ගෙවිය යුතු ඉන්ධන සඳහා ගැළපීම | **-** | 2,850 |
| | **57,722,344** | (54,461,422) |
| පොළී ආදායම | **(803,260)** | (378,610) |
| පාරිතෝෂික ගෙවීම් | **(101,100)** | (83,923) |
| කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය / අලාභය | **56,817,984** | (54,923,955) |
| කාරක ප්‍රාග්ධන විචල්‍යන් | | |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු වටිනාකම් අඩු වීම්/ වැඩි වීම් | **(16,668,746)** | (4,492,846) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වටිනාකම් අඩු වීම් / වැඩි වීම් | **(5,229,053)** | 24,807,935 |
| තොග අඩු වීම්/ වැඩි වීම් | **(266,398)** | (184,905) |
| | **34,653,788** | (34,793,770) |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **34,653,788** | (34,793,770) |

ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය

| | | |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | **(5,659,147)** | (5,998,099) |
| දේපළ පිරියත හා උපකරණවල කෙරීගෙන වැඩ | **(9,875,030)** | - |
| වත්කම් විකුණුමේ ලද වටිනාකම් | **-** | 19,940 |
| පොළී ආදායම් | **803,260** | 378,610 |
| ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **(14,730,917)** | (5,599,549) |
| මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | |
| ස්ථාවර වත්කම් මිලදී භාණ්ඩාගාරයෙන් ලද මුදල් | **-** | 21,534,441 |
| බැදුම්කරවලින් ලද මුදල් | **-** | 1,821,534 |
| මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ ලාභය | **-** | 23,355,975 |
| මුදල් හා සමාන දෑවල ශුද්ධ වෙනස් වීම් | **19,922,871** | (16,689,747) |
| වර්ෂ ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ | **19,441,420** | 36,131,167 |
| වර්ෂ අවසානයේ පවතින මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | **39,364,291** | 19,441,420 |

සටහන - අ - මුදල් හා මුදල් සමාන දෑ

| | | |
|---|---|---|
| | **Rs.** | Rs. |
| බැංකු තැම්පතු | **32,104,294** | 19,441,420 |
| | **32,104,294** | 19,441,420 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්ඒ/ඩී/එන්අයිඑල් ඊටී/එෆ්එස්/01/18/ 20

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 27 දින

සභාපති

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත- 01) ලේකම්, ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා ,සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය

02) ලේකම්,මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : පීඑච්/ඩී/එන්අයිඑල්ඊටී/එෆ්ඒ/01/18/20

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2019 මැයි 27 දින

සභාපති

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2018 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධිවිධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

42

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිත අංක 08 හි 41 ඡේදයේ පරිදි නිශ්චිතව අයභාර උපලබ්ධි විම හඳුනා නොගෙන 2018 දෙසැම්බර් 31 දිනට රු.14,201,683ක මුදලක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු හා ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණද, අමාත්‍යාංශය බැරකම් ලෙස දක්වා තිබුණේ රු. 11,973,583 ක් පමණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.5,717,770 ක් වූ පරිගණක උපාංග වල තර්ක වෙළඳපල අගය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය නොවන බැවින් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වාර්ෂික ගොඩනැගිලි කුලිය රු.17,595,000 ක් වූවද, මූල්‍ය ප්‍රකාශනවල රු.17,212,500 ක් වශයෙන් දැක්වීමෙන් ගොඩනැගිලි කුලී වටිනාකම රු. 382,500 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(iii) 2017 වර්ෂයේදි ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම්ගත කිරීමේදී ප්‍රත්‍යාගණනය නොකරන ලද වාහන දෙකෙහි පිරිවැය වූ රු. 2,593,915 ක වටිනාකම වාහන ගිණුමෙන් ඉවත් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී සමෙහයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (i) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම්

3

මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම්

4

39

මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (111) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1:2 (ආ)(iii) හි සඳහන් නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානය ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ට) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති, විධිවිධානවලට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(2) | ලබාදුන් අත්තිකාරම් අදාල කාර්යය නිම කල වහාම පියවිය යුතු වුවද, නිලධාරිනියකට 2018 ඔක්තෝබර් මාසයේදී ලබාදුන් රු.100,000 ක අත්තිකාරම 2018 දෙසැම්බර් 31 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත | 2018 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.35,711,789 කශේෂය කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

5

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෝටර් රථයක් සඳහා 2017 හා 2018 වර්ෂවලදී අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.535,639 ක් රු.240,963 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ධාවනයේ යොදවා තිබුණේ මාස 03 ක් පමණි.

(ii) ආයතනය සතු ත්‍රීවිල් රථය 2018 වර්ෂය තුලදී ධාවනයේ යොදවා නොතිබුණි.

(iii) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන මුද්‍රණය කරන ලද වටිනාකම රු.593,215 ක් වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) සම්මන්ත්‍රණ මාලා අත්පොත් 4,985 ක් 2018 දෙසැම්බර් 31 දින දක්වාම බෙදා හැරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ)දෙවන බස දෙමළ / සිංහල විෂයයට අදාල සම්මන්ත්‍රණ මාලාව පැවැත්වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,553,000 ක් වැය කර අත්පොත් 13,000 ක් මුද්‍රණ කටයුතු සිදුකර ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (අ), 4.3.1 (අ) සහ 2.14.1 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2018 වර්ෂයේදී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදන කාර්යයන් 5 කදී එකතු වටිනාකම රු.1,728,800 ක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ඇ), 5.3.10 (ආ), 5.3.18 (ආ) හා 6.3.3 (ආ) මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) "දන්නවානම් උගන්වන්න දන්නෙ නැත්නම් ඉගෙන ගන්න." යන තේමාව යටතේ වූ ගුවන්විදුලි වැඩසටහනේ පූර්ව ප්‍රචාරන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.1,559,725 ක් හා රු. 2,564,899 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණද, ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 4.3.1 (ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) **පුහුණු වැඩසටහන් වල කාර්යසාධනය**

---

ඇස්තමේන්තුගත වියදම රු. 4,216,900 ක් වූ අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) සිසුන් 8000 ක් වෙනුවෙන් සම්මන්ත්‍රණ 56 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද, ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 64 කට සමාන රු.2,914,948 ක් වැය කර සිසුන් 5910 ක් වෙනුවෙන් සම්මන්ත්‍රණ 36 ක් පමණක් පවත්වා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
**විගණකාධිපති**